පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය

நிருவாகத்துக்கான பாராளுமன்ற ஆணையாளர் அலுவலகம் (ஒம்புட்ஸ்மன்)

OFFICE OF THE PARLIAMENTARY COMMISSIONER FOR ADMINISTRATION (OMBUDSMAN)

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

2025

වැය ශීර්ෂ අංකය

செலவீன தலைப்பு இலக்கம் 022

Expenditure Head No

පළමු මහල, අංක-14, ආර්.ඒ.ද මෙල් මාවත,කොළඹ - 04

முதலாவது மாடி, இல -14, ஆர்.ஏ.டி மெல் மாவத்தை,கொழும்பு – 04

1st Floor, No-14, R.A.De Mel Mawatha, Colombo – 04, Sri Lanka

පටුන

පිටු අංකය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1-16

1.1 හැඳින්වීම 1

1.2.1 දැක්ම 1

1.2.2 මෙහෙවර 2

1.2.3 අරමුණ 2

1.3 ප්‍රධාන කාර්යයන් 2-4

1.4 සංවිධාන සටහන 5

1.5 පැමිණිලි සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය 6-21

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම 24-32

2. සංඛ්‍යානමය විශ්ලේෂණ 22-30

- **2.1** සංඛ්‍යානමය විශ්ලේෂණය 23
- **2.2** පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ ආකාරය 24
- **2.3** මාසික විශ්ලේෂණය 25
- **2.4** ස්ත්‍රී/පුරුෂ වශයෙන් ලද පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය 26
- **2.5** දිස්ත්‍රික්ක විශ්ලේෂණය 27
- **2.6** විෂය විශ්ලේෂණය 28
- **2.7** අමාත්‍යාංශ/සංස්ථා/ මහජන ආයතන විශ්ලේෂණය 29
- **2.8** වසර 10 තුල ලද පැමිණිලි විශ්ලේෂණය 30

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 31-42
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 43
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 43
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 44
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 45-53

8. අවසන් නිගමන 54-56

9. ස්තුති ලිපි (ඇමුණුම)

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 ව්‍යවස්ථාව හඳුන්වාදීමත් සමඟ, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය ස්ථාපනය කිරීම සඳහා වන නීතිමය පදනමේ ආරම්භය විය. අනතුරුව එම ධූරයේ බලතල, වගකීම් හා කාර්යයන් විස්තරාත්මකව පැහැදිලි කරමින්, 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත 1981.03.02 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීය. ඉන් පසු සම්මත වූ, ඉහත කී 1981 අංක 17 දරන පනතට 1991 අංක 16 දරන පනත හා 1994 අංක 26 දරන පනත් මගින් සංශෝධන දෙකක් සිදුකර ඇත.

අංක. 222, ගාලු පාර, කොළඹ 04 දරන ලිපිනයේ මුල්ම ඔම්බුඩ්ස්මන් කාර්යාලය 1981 වර්ෂයේදී පිහිටුවා ඇත. ඉන් අනතුරුව 1989 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා අංක. 594/3, ගාලු පාර, කොළඹ 03 ලිපිනයේ හා 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අංක. 06 එලිබැන්ක් පාර, කොළඹ 05 ලිපිනයේ, ඔම්බුඩ්ස්මන් කාර්යාලය පවත්වාගෙන ගොස් ඇත. 2017 වර්ෂයේ සිට වර්තමාන ඔම්බුඩ්ස්මන් කාර්යාලය පිහිටි අංක 14, ආර්.ඒ ද මෙල් මාවත, කොළඹ 04 ලිපිනයෙහි මෙම කාර්යාලය ස්ථාපිත කර ඇත.

1.2.1 දැක්ම

රාජ්‍ය සහ වෙනත් ඒ හා සමාන ආයතනවල නිලධාරීන්ගෙන් සිදුවන පරිපාලනමය අසාධාරණකම් පිටු දැකීමේ අරමුණින් යුක්තව, සුපරික්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කරමින්, විශේෂයෙන්ම අපක්ෂපාතී හා විනිවිද භාවයෙන් යුක්ත සාධාරණ හා යුක්ති සහගත විනිශ්චයන් ලබාදීම තුලින්, වඩා යහපත් ජනතා මෙහෙවරක් ඉටුකර දීම සහතික කිරීම සඳහා සියලු ප්‍රයත්නයන් දැරීම අපගේ දැක්ම වේ.

1.2.2 මෙහෙවර

රාජ්‍ය, පළාත් පාලන, ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා සහ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් විසින් ගනු ලබන දෝෂ සහගත පරිපාලනමය තීන්දු හේතුවෙන් සිදුවන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සිදු කරනු ලබන පැමිණිලි පිළිබඳව අපක්ෂපාතීව පරීක්ෂා කර, ඉන් අනතුරුව, එවැනි උල්ලංඝනය කිරීම් නිවැරදි කිරීම සඳහා වන ප්‍රතිකර්ම ඉදිරිපත් කරමින් ඒ සඳහා සුදුසු නියෝග, තීරණ, යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම කාර්යාලයේ කාර්ය භාරය වේ. ඉහත සඳහන් ආකාරයේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් තුලට, පරිපාලනමය අවගමනයන් සහ විවිධාකාර අනෙකුත් අසාධාරණකම් සහ ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ද ඇතුලත් වේ.

1.2.3 අරමුණ

රාජ්‍ය, පළාත් පාලන, ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා සහ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් විසින් ගනු ලබන දෝෂ සහගත පරිපාලනමය තීන්දු හේතුවෙන්, අසාධාරණයන්ට ලක් වි ඇති පුද්ගලයන්ට, එකී අයුක්තීන් නිවැරදි කරදීම හා එම ක්‍රියාවලිය තුලින් රාජ්‍ය පරිපාලනය කාර්යක්ෂමව හා ඵලදායිව ඉටුකර ගැනීමට රාජ්‍ය යාන්ත්‍රණයට සහය වීම මෙන්ම, විධායක තීරණ ගැනීමේදී, ඒවා නිවැරදි ආකාරයට හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කරලීම සඳහා කටයුතු කිරීම අපගේ ප්‍රධාන අරමුණයි.

1.3 ප්‍රධාන කාර්යයන්

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ධූරය සංස්ථාපනය කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් විධිවිධාන සලස්වනු ලැබිය යුතු බවට ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව මගින් නියම කරනු ලැබ ඇත. මෙම තනතුරේ කාර්ය භාරය වන්නේ, රජයේ නිලධාරියෙකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ සමාන වෙනත් ආයතනයක නිලධරයෙකු විසින්, සිය රාජකාරි කටයුතු ඉටු කරන අතරතුර සිදුවිය හැකි හෝ සිදු කරනු ලබන, මූලික අයිතිවාසිකම් කඩකිරීම් හෝ වෙනත් අයුක්තීන් පිළිබඳ පැමිණිලි හෝ චෝදනා පරීක්ෂා කර ඒවා නිවැරදි කරමින් ඒ සඳහා සුදුසු නිර්දේශයන් නිකුත් කිරීමයි.

ඒ අනුව, ඔම්බුඩ්ස්මන් කාර්යාලය සංස්ථාපනය කරමින් 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත නීතිගත කරනු ලැබ ඇති අතර, එම පනතෙහි ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය විස්තර කර, නිශ්චිතව දක්වා ඇත. අනතුරුව, යමෙකුගේ මූලික අයිතිවාසිකම් කඩකිරීම් හෝ වෙනත් අයුක්තීන් පිළිබඳ පැමිණිලි ඔම්බුඩ්ස්මන්වරයා හට සෘජුවම මහජනතාව වෙතින් ලබා ගැනීමට හැකිවන අයුරින්, ඉහත සඳහන් මූලික පනත, 1994 අංක 26 දරන පනත මගින් සංශෝධනය කර සම්මත කර ඇත.

සිදු වී යැයි කියනු ලබන මූලික අයිතිවාසිකම් කඩවීමක්/අයුක්තියක්/අසාධාරණයක් පිළිබඳව ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරීක්ෂා කර, විමර්ශනය කරනු ලැබිය යුතු අතර පැමිණිල්ල සම්බන්ධයෙන් වගකිවයුතු අදාල රජයේ නිලධාරින්ගේ තීන්දු, නිර්දේශයන්, ක්‍රියාවන් හෝ නොකර හැරීම්; නීතියට පටහැනි වූයේ ද, අයුක්ති සහගත හා පීඩාකාරී නැතහොත් නොමනා වෙනස්කම් දක්වන්නක් වූයේ ද, නැතහොත් නොමනා කාර්යයක් සඳහා අදාල නිලධාරියාගේ අභිමතය අනුව ක්‍රියාකරන ලද්දේ ද, යන්න නිශ්චය කළ යුතුය. පුද්ගලයෙකුගේ මූලික අයිතිවාසිකම් රජයේ නිලධාරියෙකු විසින් කඩකර ඇති බවට හෝ එබඳු නිලධාරියෙකු විසින් සිදු කළ අයුක්තියකින් පීඩා විඳ ඇති බවට, නිසි පරීක්ෂණයකින් අනතුරුව ඔම්බුඩ්ස්මන්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඒ අනුව, ඔහු සිය නිශ්චයට එළඹෙනු ලබයි. අයුක්තියට භාජනය වූ පුද්ගලයා වෙත සලසනු ලබන සහන ලෙස, අදාල රජයේ නිලධාරියා විසින් සිදු කරන ලද ක්‍රියාව නැවත සලකා බලන ලෙස, නිවැරදි කරන ලෙස, අවලංගු කරන ලෙස හෝ වෙනස් කරන ලෙස නිර්දේශ කළ හැකි අතර, එම රජයේ නිලධාරියා අයත් වන ආයතනයේ ප්‍රධානියා විසින්, එම නිර්දේශ නිශ්චිත කාලයක් තුල ක්‍රියාත්මක කිරීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයා විසින් යෝජනා කරනු ලබන අතර, ඉන් අනතුරුව අදාල නිලධාරියා විසින් ඒ සම්බන්ධයෙන් ගන්නා ලද පියවර පිළිබඳව ඔහු විසින් දැනුම් දිය යුතුය.

අවසන් ලෙස සඳහන් කලයුතු වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කිරීමට සහ රජයේ හා ඒ හා සමාන වෙනත් ආයතනවල නිලධාරින්ගේ ක්‍රියාවන් මගින් සිදුවන අසාධාරණකම් හා අයුක්තීන්ගෙන් ඔවුන් ආරක්ෂා කර ගැනීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයා වෙත උතුම් රාජකාරියක් පැවරී ඇති බවයි. එමෙන්ම, ඉහත කී පරිදි ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු ව්‍යවස්ථාවන්හි සඳහන් කරුණු සහ ව්‍යවස්ථාදායක අණපනත් සහ ඒවාට අනුකූලව සම්මත වී ඇති රෙගුලාසිවල සඳහන් විධිවිධාන ද, රාජ්‍ය ආයතන මගින් නිකුත් කළ විවිධ චක්‍රලේඛ වල අඩංගු රීතීන් ද සැලකිල්ලට ගෙන රජයේ පරිපාලන ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක වීම සහතික කිරීම ද ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්ය වන බව සඳහන් කළ යුතුය.

පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ අදියරයන්

Parliamentary Commissioner for Administ
(OMBUDSMAN)

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය
நிருவாகத்துக்கான பாராளுமன்ற ஆணையாளர் அலுவலகம் (ஒம்புட்ஸ்மன்)
OFFICE OF THE PARLIAMENTARY COMMISSIONER FOR ADMINISTRATION (OMBUDSMAN

පැමිණිලි/පෙත්සම් →

- ❖ ලියාපදිංචි තැපැල මගින්
- ❖ සාමාන්‍ය තැපැල මගින්
- ❖ විද්‍යුත් තැපැල මගින්
- ❖ අතින් ගෙනවිත් භාර දීමෙන්

↓

පරිපාලන නිලධාරි

- ➢ දෛනික තැපැල විවෘත කිරීම හා දින මුද්‍රා මත අත්සන් තැබීම.

↓

ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි

- ➢ දෛනිකව කාර්යාලය වෙත යොමු වන පැමිණිලි ලියාපදිංචි කිරීමේ ලේඛණයේ සටහන් කිරීම.
- ➢ විෂය වර්ගීකරණය අනුව අදාල විෂය භාර නිලධාරියා වෙත යොමු කිරීම.

↓

විෂය භාර නිලධාරි

- ➢ තම විෂයට අදාලව යොමු වන පැමිණිලි භාර ගෙන ලිපිගොනු විවෘත කිරීම.
- ➢ තමා වෙත පැමිණිලි ලැබුණු වහාම ඒ පිළිබඳව ක්‍රියාත්මක වන අතර, ඒ පිළිබඳව ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු වී වාචික උපදෙස් හා නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග වෙත යොමු වනු ලැබේ.

↓

පරිපාලන නිලධාරි

↓

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)

- ➢ සෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන්ම ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු වී උපදෙස් ලබා ගැනීම.
- ➢ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කරනු ලබන පැමිණිලි/චෝදනා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී එම පැමිණිලි/චෝදනා තුල අන්තර්ගත කරුණු සුපරීක්ෂාකාරී ලෙස සලකා බැලීම මගින් ඔම්බුඩ්ස්මන්වරයාගේ බල සීමාව ඇතුළතට ගැනෙන්නේ ද යන්න නිශ්චය කිරීම සිදු කරනු ලබයි. එහිදී, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ විෂය පථය තුලට නොගැනෙන්නේ නම්, එම කරුණ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වමින් පැමිණිලිකරු වෙත වහාම ඒ පිළිබඳව දැනුම් දීම සිදු කරනු ලබයි.
- ➢ පැමිණිල්ලේ ඇතුළත් තොරතුරු ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී ඔම්බුඩ්ස්මන්වරයාගේ උපදෙස් පරිදි ඊට අදාල වැඩිමනත් තොරතුරු පැමිණිලි පාර්ශවය වෙතින් ලබා ගැනීමට කටයුතු කිරීම. (OMB 01 ආකෘති පත්‍රය මගින්)
- ➢ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ බලතල යටතට ගැනෙන පැමිණිලි ලේඛණගත කර, ඔම්බුඩ්ස්මන්වරයා විසින් ලබා දෙන උපදෙස් පරිදි, මුලිකවම පැමිණිල්ලේ පිටපතක් වගඋත්තරකාර නිලධාරියා වෙත යොමු කරමින් වාර්තාවක් කැඳවීම සිදු කරන අතර, එම ලිපියේ පිටපතක් පැමිණිලි පාර්ශවය වෙත ද යොමු කෙරේ.
- ➢ පැමිණිල්ලේ පිටපතක් අදාල වගඋත්තරකාර නිලධාරීන් වෙත යවා ඒ අනුව කැඳවනු ලබන වාර්තා තුලින් පැමිණිලි පාර්ශවයට සහනයක් ලබා දිය හැකි අවස්ථාවලදී එම සහනය ලබා දීමට පියවර ගැනීම.
- ➢ ඔම්බුඩ්ස්මන්වරයාගේ උපදෙස් පරිදි කැඳවනු ලබන ලිඛිත වාර්තා වලට අතිරේකව ඔම්බුඩ්ස්මන්වරයා වෙත දෙපාර්ශවයම කැඳවා ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව සුදුසු නිර්දේශ අදාල බලධාරීන් වෙත ලබා දීමට කටයුතු කිරීම.

1.4 සංවිධාන සටහන

මෙම කාර්යාලයට අනුමත සේවක සංඛ්‍යාව 32 කි. කෙසේ වුවද, සංවිධාන ධූරාවලියේ පෙන්වා ඇති පරිදි 2025 වසරේ අවසානය වන විට මෙම කාර්යාලයට අනුයුක්ත කර තිබුණේ නිලධාරීන් 20 දෙනෙකු පමණි. (පහත සටහන බලන්න) අනුමත කාර්ය මණ්ඩලයට වඩා අඩු පිරිසක් සිටීම හේතුවෙන්, කාර්යාල කටයුතු ප්‍රමාද වීමට ඉඩකඩ ඇතත් කෙසේ හෝ අපගේ කාර්යයන් අප්‍රමාදව කරගෙන යාමට කාර්යාල නිලධාරීන් කටයුතු කරනු ලබයි.

සංවිධාන ධූරාවලිය



1.5 පැමිණිලි සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය

මෙම කාර්යාලය වෙත ලැබෙන සෑම පැමිණිල්ලක්ම/පෙත්සමක්ම වෙනම ලේඛනයකට ඇතුලත් කරනු ලබන අතර, ඉන් අනතුරුව එම පැමිණිල්ල සඳහා විශේෂිත අංකයක් දෙනු ලබයි. ඉන්පසු මෙම පැමිණිලි, විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැටුප් විෂමතා, වැටුප් වර්ධක, උසස්වීම්, ඉඩම්, අනවසර ඉදිකිරීම්, සේවය අවසන් කිරීම්, තනතුරෙහි නැවත පිහිටුවීම්, සේවා අන්තර්ග්‍රහණය කිරීම්, විශ්ව විද්‍යාල/පාසල් වලට ඇතුලත් කිරීම් හා බලය අනිසි ලෙස භාවිතා කිරීම් ආදිය ලෙස විෂයයන් අනුව වර්ගීකරණය කරනු ලැබේ. මෙම කාර්යාලයේ නිලධාරීන් වෙත පවරා ඇති සහ ඔවුන් විසින් කටයුතු කරන විශේෂිත විෂයයන් මේවා වන අතර, එම නිලධාරීන් රාජ්‍ය සේවයේ “කළමනාකරණ සේවා නිලධාරීන්” යන කාණ්ඩයට අයත් වේ. පැමිණිල්ලක් ලියාපදිංචි කිරීමෙන් පසුව එය අදාල කළමනාකරණ සේවා නිලධාරියා (විෂයභාර ලිපිකරු) වෙත යොමු කරනු ලබන අතර, ඉන් අනතුරුව එක් එක් පැමිණිල්ල සඳහා ලිපිගොනුවක් විවෘත කිරීම ඔවුන් සතු කාර්යයක් වේ. මෙම විෂය ප්‍රස්තුතය තෝරා ගැනීම සිදු කරනු ලබන්නේ කාර්යාලයේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිනිය විසිනි.

යම් පැමිණිල්ලකට අදාලව ලිපිගොනුවක් විවෘත කළ විට එම පැමිණිල්ලේ අන්තර්ගත කරුණු සාරාංශගත කරමින් අදාල විෂයභාර ලිපිකරු විසින් ලිපිගොනුවෙහි සාරාංශ සටහනක් යොදනු ලබයි. ඉන් පසු ඔහු/ඇය විසින් පරිපාලන නිලධාරිනිය සමග පැමිණිල්ලේ ස්වභාවය පිළිබඳව සාකච්ඡා කර, විෂයභාර ලිපිකරු හෝ අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන් දෙදෙනාම ඔම්බුඩ්ස්මන්වරයා හමුවට පැමිණ පැමිණිල්ල සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව, ඔහුගේ උපදෙස් හා මගපෙන්වීම ලබා ගනියි.

එය ඉතා වැදගත් හමුවක් වන අතර, එම අවස්ථාවේදී ඔම්බුඩ්ස්මන්වරයා විසින්, ලැබී ඇති පැමිණිල්ලේ අන්තර්ගත කරුණු සහ එම පැමිණිල්ල සමග අමුණා ඇති අනෙකුත් ලේඛන වල අන්තර්ගතය සුපරික්ෂාකාරීව සලකා බලනු ලැබේ. පළමුව සහ ප්‍රධාන වශයෙන් පරික්ෂා කළ යුතු වන්නේ පැමිණිල්ල/චෝදනාව ඔම්බුඩ්ස්මන්වරයාගේ බල සීමාව ඇතුලතට වැටෙන්නේ ද යන්න නිශ්චය කිරීමයි. මෙම කරුණ තීරණය කිරීමේදී ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 10, 11 සහ 17 යන වගන්තිවල අන්තර්ගත කරුණු වෙතද සිය අවධානය යොමු කරනු ලබයි. එවනු ලබන පැමිණිල්ල, පනතේ විෂය පථය තුලට නොගැනෙන්නේ නම්, එම කරුණ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වමින් පැමිණිලිකරු වෙත ඒ පිළිබඳව වහාම දැනුම් දෙනු ලැබේ.

ඔම්බුඩ්ස්මන්වරයා විසින් අදාල ඉල්ලීමේ ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට තීරණය කරන අවස්ථාවේදී එක් එක් පැමිණිල්ල සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව ඔහු විසින් සුදුසු යැයි නිගමනය කරනු ලබන නියෝගයන් කරනු ලැබේ. අපේක්ෂිත සහනය සහ පැමිණිල්ල කරනු

ලබන්නේ කුමන අයෙකුට එරෙහිව ද ආදී කරුණු පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය බවට ඔම්බුඩ්ස්මන්වරයාට හැඟේ නම්, එම තොරතුරු පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ඉන්පසු පනතෙහි විධිවිධාන වලට අනුකූලව එම කරුණ විමර්ශනය කොට අවසන් කිරීමට සෑම උත්සාහයක්ම දරනු ලබන අතර, එම කටයුත්ත නිරන්තරයෙන්ම පැමිණිල්ලේ ස්වභාවය මත රඳා පවතී.

අදාල කරුණ පිළිබඳ ඉදිරි විමර්ශන කටයුතු සිදුකරගෙන යාම ඒ ඒ අවස්ථානුකූලව තීරණය කරන අතර, බොහෝවිට නිරීක්ෂණ කැඳවනු ලබන්නේ චෝදනාවට ලක්ව ඇති අයට වඩා ඉහල මට්ටමකට අයත් නිලධාරීන්ගෙනි. එලෙස නිරීක්ෂණ කැඳවීමෙන් පසු, පැමිණිලිකරු ඉල්ලා ඇති සහන සැලසීම සඳහා අදාල බලධාරීන් විසින් එම පරිපාලනමය දෝෂ නිවැරදි කිරීමට පියවර ගෙන ඇති අවස්ථාවන් ද ඇත. එහෙත්, අදාල ගැටලුව සම්බන්ධයෙන් නිලධාරීන්ගෙන් නිරීක්ෂණ ලබා ගැනීම සඳහා සිහි කැඳවීම් යැවීමට ද මෙම කාර්යාලයට සිදු වූ අවස්ථා ද බොහෝමයකි. ලිපි කිහිපයක් හුවමාරු වීමෙන් පසුව ඔම්බුඩ්ස්මන්වරයා වෙත අර්ථාන්විත ප්‍රතිඵල දැක ගැනීමට ලැබුණු අවස්ථාවන් ද සෑහෙන සංඛ්‍යාවක් විය. ඔම්බුඩ්ස්මන්වරයා හට පිළිගත හැකි තීරණයකට එළඹීමට නොහැකි අවස්ථාවන්හිදී පරීක්ෂණයක් පැවැත්වීම සඳහා, අදාල පාර්ශවයන් මෙම කාර්යාලය වෙත කැඳවනු ලබයි.

මෙම පරීක්ෂණය පැවැත්වෙනුයේ, සෑම පාර්ශවයක් සඳහාම තමාට අදාල කරුණු එකිනෙකා ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් ස්වභාවික යුක්තියේ රීතීන් පිළිපදිමිනි. පෙර සඳහන් කළ පරිදි, මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීමක් හෝ වෙනත් අයුක්තියක් ඔප්පු වූ ඕනෑම විටක, ඔම්බුඩ්ස්මන්වරයා විසින් වින්දිතයා හට සහන සැලසීම සඳහා සෑම උත්සාහයක්ම දරනු ලැබේ. එබඳු ක්‍රියාමාර්ගයක් තුලින් පිළිගත හැකි විසඳුමකට එළඹීමට අපොහොසත් වුවහොත්, අදාල කරුණ විසඳීම සඳහා වැඩිදුරටත් පරීක්ෂණ පැවැත්වීමට නියම කරනු ලැබේ. ඔම්බුඩ්ස්මන්වරයාගේ එම සියලු උත්සාහයන් අසාර්ථක වුවහොත්, ඔහු එම ගැටලුව පිළිබඳව තීන්දුවක් ගෙන, ඒ අනුව සුදුසු නිර්දේශ ඉදිරිපත් කරමින්, එය වගඋත්තරකාර පාර්ශ්වය වෙත දැනුම් දෙන අතර, දී ඇති කාල සීමාවක් තුල එම තීන්දුව ක්‍රියාත්මක කරන ලෙස ද දැනුම් දෙනු ලැබේ. එසේ නිශ්චිතව ලබා දුන් කාල සීමාව තුලදී බලධාරීන් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැතිනම්, ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඔහුගේ පරීක්ෂණ වාර්තාවේ පිටපතක්, ආවරණ ලිපියක් සහිතව සුදුසු ක්‍රියාමාර්ගයන් සඳහා අතිගරු ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව වෙත යොමු කරනු ලැබේ. ඉහත සඳහන් ක්‍රියාදාමය අනුගමනය කිරීමේදී ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ නිලධාරීන් සෑම විටම එම කරුණ සම්බන්ධව රහස්‍යභාවය ඉතාමත් ඉහල මට්ටමකින් පවත්වාගෙන යනු ලබන බව මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුය.

එමෙන්ම, ඔම්බුඩ්ස්මන්වරයාගේ මැදිහත්වීම අපේක්ෂා කළ ඉල්ලුම්කරුවන් සඳහා මෙම කාර්යාලය මගින් විවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි සලසන ලද සහන සම්බන්ධ කරුණු කිහිපයක් වෙත අවධානය යොමු කිරීමට අදහස් කරමි. එකී කරුණු අධ්‍යයනය කිරීමෙන්, මෙම කාර්යාලය වෙතින් සිදු කරන ලබන ඉල්ලීම්වල ආකාරය සහ එහි ස්වභාවය පිළිබඳව, නියමාකාර අවබෝධයක් ඇති කර ගැනීමට හැකි වනු ඇත.

අංකය : OMB/P/2/1/693/2024 **ඩබ්.පී.ප්‍රසන්න මහතා.**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ හ/විහාරගල 550 මහා විද්‍යාලයේ විදුහල්පති ඩබ්.පී.ප්‍රසන්න මහතා විසින් 2024.11.18 දින මෙම කාර්යාලයට යොමු කරන ලද පැමිණිල්ලෙහි සඳහන් වන්නේ හ/විහාරගල 550 මහා විද්‍යාලයේ නැගෙනහිර මායිමේ මායිම් ගැටළුවක් පැන නැගී ඇති බැවින් එම මායිමෙන් ප්‍රවේශ මාර්ගය තිබෙන භූමිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු බැවින් වසර 30ක් තිස්සේ පවතින මෙම ගැටළුවට විසඳුමක් ලබාදෙන ලෙසයි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් මෙම ගැටළුව සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවන ලදී. 2025.02.17 දිනැතිව මහවැලි අධිකාරියේ වලව නේවාසික ව්‍යාපාර කළමනාකාරු අපටද පිටපත් සහිතව අධ්‍යක්ෂ (ඉඩම්) වෙත එවා ඇති ලිපියේ සඳහන් පරිදි අදාල ඉඩම හරහා අඩි 12ක ප්‍රවේශ මාර්ගයක් කම්බි ගසා වෙන්කර දී ඇති බව දන්වා ඇත. ඒ අනුව පාසලට අවශ්‍ය පරිදි තාප්පයක් හා ගේට්ටුවක් ඉදිකිරීමට අවශ්‍ය වූ ලිපි නිදහස් කර ඇති බව 2025.02.17 දිනැති වාර්තාව මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත. වසර 20ක් පමණ ලිපි ගනුදෙනු සිදුවුවද නොවිසිඳුනු මෙම ගැටළුව පැමිණිල්ල ඉදිරිපත් කර මාස 03ක් වැනි කෙටි කාලයකදී නිරාකරණය කරදීමට මෙම කාර්යාලයේ මැදිහත්වීම මත හැකිවිය.

අංකය : OMB/P/2/1/623/2024 **ඩබ්.ඩී.සී.චන්දිමාලි මිය**

ගාල්ල දිස්ත්‍රික්කයේ ගෝනපිනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගෝනපිනුවල, බද්දේගම පාර, "බදිරාලි" ලිපිනයෙහි පදිංචි ඩබ්.ඩී.සී.චන්දිමාලි මහත්මිය විසින් 2024.02.14 දින මෙම කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එම පැමිණිල්ලෙහි සඳහන් වනුයේ පැමිණිලිකාරියගේ නිවස පිහිටි ඉඩම මායිමේ ඉදිකර ඇති තෙමහල් ගොඩනැගිල්ලේ එක බිත්තියක් මායිමට වන්නට ඉදිකර බිම් මහල හැර අනෙකුත් මහල් දෙකේ මායිම් බිත්තියෙහි ජනෙල් කවුළු තබා ඇති බව හා ජලනල පැමිණිලිකාරියගේ ඉඩමෙන් යොදා ඇති බවයි. මෙලෙස මායිම් බිත්තිය අන්ධ බිත්තියක් ලෙස ඉදි නොකිරීමෙන් තමන්ගේ පෞද්ගලිකත්වයට හානිවන බැවින් මේ සම්බන්ධව අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත වරින්වර දැනුම් දුන්නද එම ගැටළුව විසඳීමට කිසිදු විසඳුමක් මේ දක්වා ලැබී නොමැති බව දන්වා ඇත. මෙම ගැටළුව සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙතින් 2024.03.22 දිනැතිව වාර්තාවක් කැඳවන ලදී. අදාල ස්ථානය අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරියෙකු විසින් නිරීක්ෂණය කර අදාල ඉදිකිරීම් සහ අන්ධ බිත්තියට යොදා තිබුන කවුළු හා ජලනල ඉවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බව අප වෙත එවන ලද 2024.04.09 දිනැති වාර්තාවෙන් දන්වා ඇත. නමුත් මාස 03 ක කාලයක් තුල එම ගැටළුව විසඳී නොමැති බව පැමිණිලිකාරිය විසින් දන්වා තිබූ අතර, නැවතත් දෙපාර්ශවය කැඳවා එකගවූ පරිදි නීතිමය පියවර ගනු ලබන බව 2025.03.12

දිනැති ලිපිය මගින් ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් දන්වා ඇත. අප ආයතනය වෙත පැමිණිලිකර වසරක් පමණ ගතවී තිබීම මත නැවතත් විමසීම් කල අතර, 2025.04.10 දිනැති ලිපිය මගින් ප්‍රාදේශීය සභාව විසින් දන්වා ඇත්තේ, ඉදිකිරීම්කරු විසින් ගොඩනැගිල්ලේ මායිම් බිත්තියට ඇති ජනෙල් කවුලු වසාදමා ඇති බවත්, පැමිණිලිකාරියගේ ඉඩමෙන් එලා ඇති ජලනල බටද ඉවත්කර ඇති බවයි. ඒ අනුව අපගේ මැදිහත්වීම මත අදාල ගැටුලුකාරී තත්ත්වය ඉවත් කිරීමට හැකිවූ අතර පැමිණිලිකාරිය වන ඩබ්.ඩී.සී.චන්දිමාලි මහත්මියගේ ඉල්ලීම ඉටුවිය.

අංකය : OMB/P/2/2/4088/2023 **ඩබ්.එම්.පියදාස මහතා**

දෙමෝදර, ගවරවෙල, බැද්දෙවෙල, අඹගහපතන ලිපිනයෙහි පදිංචි, ඩබ්.එම්.පියදාස මහතා විසින් තමාගේ ඉඩමෙන් පර්චස් 03ක් යාබද ඉඩම්හිමියා විසින් අල්ලාගෙන සිටින බවත් මෙම මායිම් ගැටළුව නිරවුල් කර දෙන ලෙස වසමේ ග්‍රාම නිලධාරීගෙන් හා ඉඩම් නිලධාරීගෙන් ඉල්ලුම් කළත් සහනයක් නොවූ බැවින් තම ගැටළුව 2023.10.03 දිනැතිව මෙම කාර්යලයට යොමු කර ඇත.

මේ සම්බන්ධයෙන් මෙම කාර්යාලය මගින් ඇල්ල ප්‍රාදේශීය ලේකම් වෙතින් 2023.10.31 දිනැතිව වාර්තා කැඳවමින් මෙම ගැටළුව විසඳීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ඇතුළත් තොරතුරු විමසන ලදි.

ඊට පිළිතුරු ලෙස 2023.12.22 දිනැති ව ඇල්ල ප්‍රාදේශිය ලේකම් විසින් වාර්තාවක් එවමින් දන්වා ඇත්තේ බදු/ප්‍ර 20073 දීමනා පත්‍රයෙන් බැඳි ඉඩම භුක්ති විදිනු ලබන ඩබ්.එම්.පියදාස යන අය හා බදු/ප්‍ර 20098 දරණ දීමනා පත්‍රයෙන් බැඳි ඉඩම භුක්ති විදිනු ලබන ඩබ්.එම්.බේබිසිංඤෝ යන අය අතර මායිම් සම්බන්ධයෙන් නිරන්තරයෙන් ආරවුල් ඇති කර ගන්නා බැවින් අදාළ ඉඩම දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ මැන වෙන්කර ගැනීම සඳහා වන ලේඛන ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස 2025.12.09 දිනැතිව ඩබ්.එම්.පියදාස මහතා විසින් තමාට අහිමි වූ පර්චස් 03 තමාට හිමි වූ බවත් එමෙන්ම තමාගේ දීමනාපත්‍රයට හිමි විය යුතු පර්චස් 36ක ඉඩම් කොටස තමා වෙත නිරවුල්ව ලැබුනේ මෙම කාර්යාලයේ මැදිහත්වීමෙන් බව ප්‍රශංශාත්මකව දැනුම් දී ඇත.

එහි පිටපතක් පැමිණිලිකරුට යවා තිබීම හේතුවෙන් පැමිණිලිකරු වන ඩබ්.එම්.පියදාස මහතා 2024.01.10 වන දින නැවත ලිපියක් මගින් 1992 වසරේ සිට පැමිණිලිකරු විසින් වගා කළ පර්චස් 64 ඉඩම බේරා දෙන ලෙස දන්වා ඇත. ඒ අනුව 2024.01.30 දිනැතිව නැවතත් ඇල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමුකරමින් බලපත්‍රයේ සඳහන් පර්චස් 36 ට අමතරව පැමිණිලිකරු භුක්ති විඳින තවත් ඉඩම් කොටසක් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග විමසා ඇත. ඊට පිළිතුරු ලෙස 2024.05.07 දිනෙන් ඇල්ල ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත්තේ ඔහු විසින් භුක්ති විදිනු ලබන ප්‍රදාන පත්‍රයට අමතරව හිමිකම් ලේඛනයක් නොමැති රජයේ ඉඩම් කොටසක් හඳුනාගත නොහැකි අතර ප්‍රදානපත්‍ර ඉඩම් කොටස දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ මැනුම්

කිරීමෙන් පසු රජයේ ඉඩම් කොටසක් හඳුනාගතහොත් ඒ සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගැනීමට හැකි බවයි.

පැමිණිලිකරුට ඒ බව දන්වා 2024.05.30 දින ලිපියක් යවමින් අදාළ ලේඛන ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ප්‍රගතිය අප වෙත දන්වන ලෙස දැනුම් දී ඇත.

ඒ අනුව පැමිණිලිකරු 2024.06.13 දින මෙම කාර්යාලයට ලිපියක් එවමින් දන්වා ඇත්තේ, මෙම විෂයගත ඉඩම උසාවි නියෝග අනුව මැනුම් කාර්යාලය මගින් හා උසාවි මිනින්දෝරු මහතුන් මගින් මැනුම් කටයුතු සිදුකර ඇති අනු රේඛන තිබියදීත් නැවත මැනීම අවශ්‍ය බව ඉඩම් නිලධාරී විසින් තමා වෙත දන්වා ඇති බවයි. නමුත් තමා ආබාධිත වයස්ගත පුද්ගලයෙකු බැවින් හා ඒ සඳහා වැය කිරීමට තමා වෙත මුදල් නොමැති බැවින් තම ඉඩම නිරවුල් කර දෙන ලෙස ඉල්ලා ඇත.

මේ සම්බන්ධයෙන් 2024.07.10 දිනැතිව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත්තේ රජයේ ඉඩම් මැනීමෙන් පසු රජයේ ඉඩම් කොටසක් හඳුනාගතහොත් ඒ සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගැනීමට හැකි බවයි. ඒ අනුව මෙම ඉඩම් කොටස උසාවි නියෝගයක් මත මැනුම් කර ඇති බැවින් නැවත මැනීමක් අවශ්‍ය වන්නේද සහ මෙම මැනුම් කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඉටු කිරීමේ හැකියාවක් පවතින්නේද යන්න නැවත ප්‍රාදේශීය ලේකම් වෙතින් 2024.07.18 දින විමසා සිටි අතර, සිහිකැඳවීම් කිහිපයක් සිදුකරන ලදී. මැනුම් ඉල්ලීම 2024.09.18 යොමුකර ඇතත් එයද ප්‍රමාද වී ඇති බැවින් බදුල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙතින් 2025.03.12 දිනැතිව ඒ පිළිබඳව විමසීම් කරන ලදී. ඒ සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී 2025.08.21 දිනැතිව දන්වා ඇත්තේ 2025.09.11 දින අදාල මැනුම් කටයුතු අවසන් කරන බවයි.

පසුව 2025.11.17 දින ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මෙම කාර්යාලයට පිටපතක් සහිතව ඩබ්.එම්.පියදාස මහතා වෙත දන්වා ඇත්තේ අදාළ මිනින්දෝරු සැළැස්ම හා කැබලි විස්තරයේ පිටපතක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී බදුල්ල වෙතින් ලබාගත හැකි බවයි. ඒ බව පැමිණිලිකරු වන ඩබ්.එම්.පියදාස මහතාට 2025.11.24 දින දන්වමින් ලිපියක් යවා ඇත.

මේ අන්දමින් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2025.12.09 දිනැතිව ඩබ්.එම්.පියදාස මහතා විසින් තමාට අහිමි වූ පර්චස් 03 තමාට හිමි වූ බවත් එමෙන්ම තමාගේ දීමනාපත්‍රයට හිමි විය යුතු පර්චස් 36ක ඉඩම් කොටස තමාවෙත නිරවුල්ව ලැබුණේ මෙම කාර්යාලයේ මැදිහත්වීමෙන් බව ප්‍රශංශාත්මකව දැනුම්දී ඇත.

රාජගිරිය, ඔබේසේකරපුර, නානායක්කාර මාවත, අංක. 162හි පදිංචි අමරා ශිල්පගේ රුබන් සුදර්මා මානෙල් මහත්මිය විසින් 2025.01.08 දිනැතිව මෙම කාර්යාලයට දන්වා ඇත්තේ තම පියාට අයිතිය ඇති දේපළවල හිමිකාරීත්වය තමාට ලබාදීම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් ප්‍රමාද කරමින් සිටින බැවින් මේ සම්බන්ධයෙන් තමාට සාධාරණයක් ඉටු කර දෙන ලෙසයි.

මේ සම්බන්ධයෙන් මෙම කාර්යාලය මගින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභාව වෙතින් 2025.10.24 දින කරනලද විමසීම් අනුව දිගු කාලීනව විසඳාගත නොහැකිව තිබූ තම ඉඩම් හිමිකාරීත්ව ගැටළුව විසඳී ඇති බව අමරා ශිල්පගේ රුබන් සුදර්මා මානෙල් මහත්මිය විසින් 2025.12.02 දිනැතිව ස්තුති පූර්වකව දැනුම්දී ඇත.

අංකය : OMB /P/2/4/5722/2025 එස්. ජයමි සංජානා ද සිල්වා මෙනවිය

මීගම, රිටිකැටිය නව ජනපදය, නො: 92 හි පදිංචි එස්. ජයමි සංජානා ද සිල්වා මෙනවිය විසින් 2025.04.02 දිනැතිව මා වෙත පැමිණිල්ලක් යොමු කරමින් දන්වා ඇත්තේ, පැමිණිලිකාරිය කැළණිය විශ්වවිද්‍යාලයේ, රාගම වෛද්‍ය පීඨයේ ආබාධිතතා අධ්‍යයන අංශයේ ශිෂ්‍යාවක බවත්, අදාළ පෙත්සම මඟින්, විශ්වවිද්‍යාලය මඟින් ඉල්ලුම්කාරිය වෙත සිදුවූ අසාධාරණයක් (මානසික හිරිහැර කිරීමක්) සම්බන්ධව පැමිණිලි කර ඇති අතර, අවසන් වසර අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කිරීමටත් පිළිතුරුපත් බාහිර අධීක්ෂකවරයෙකු යටතේ නැවත පරීක්ෂා කිරීමටත් අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසයි.

ඒ අනුව, මා විසින් කැළණිය විශ්වවිද්‍යාලයේ, රාගම වෛද්‍ය පීඨයේ ආබාධිතතා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානී වෙතින් විමසීමක් කරන ලදී. එම විමසීමෙන් පසු, 2025.06.30 දිනැති වාර්තාව මා වෙත යොමුකර තිබුණද පැමිණිල්ල සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු නොකොට දීර්ඝ සහ විමසා නොමැති කරුණු සහිත පිළිතුරක් ලබාදී තිබීම හේතුවෙන් **පැමිණිලිකාරියගේ ප්‍රශ්න පත්‍ර ස්වාධීන (බාහිර) පරීක්ෂකවරුන් විසින් නැවත පරීක්ෂාවක් සිදුකළේද? එම පරීක්ෂකවරුන් පත්කරන ලද්දේ කවුරුන් විසින්ද? සහ ඔවුන් බාහිර පරීක්ෂකවරුන්ද?** යනුවෙන් සෘජු ප්‍රශ්නයක් ඉදිරිපත් කර පැහැදිලි සහ කෙටි පිළිතුරක් දන්වා එවන ලෙස රාගම වෛද්‍ය පීඨයේ ආබාධිතතා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානී නමින්ම 2025.07.16 දිනැතිව ලිපියක් මඟින් නැවතත් නියම කරන ලදී. කැළණිය විශ්වවිද්‍යාලයේ, රාගම වෛද්‍ය පීඨයේ පීඨාධිපති විසින් 2025.07.11 දිනැතිව මෙම පැමිණිල්ල සම්බන්ධව කටයුතු කඩිනම්කරන ලෙස දන්වමින් විද්‍යුත් තැපැල ඔස්සේ ලිපියක් යොමුකර තිබූ අතර, ඒ සම්බන්ධව තෙවන පාර්ශ්වයක මැදිහත්වීමක් සඳහා අයිතියක් නොමැති බවත් ආබාධිතතා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානී වෙතින් පැහැදිලි කෙටි පිළිතුරක් එවීමට උපදෙස් ලබාදෙන ලෙසත් 2025.07.21 දිනැතිව ලිපියක් මඟින් දන්වන ලදී.

ඒ අනුව, 2025.07.24 දිනැතිව ආබාධිතතා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානී විසින් මා විසින් විමසූ ප්‍රශ්නයට පිළිතුරක් එවා තිබූ අතර, ස්වාධීන (බාහිර) පරීක්ෂකවරුන් විසින් පැමිණිලිකාරියගේ ප්‍රශ්න පත්‍ර නැවත පරීක්ෂාවක් සිදුනොකළ බව එම පිළිතුරෙහි සඳහන්කර තිබීම හේතුවෙන් ඒ පිළිබඳව ගත හැකි ක්‍රියාමාර්ගයන් පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙතින් 2025.08.05 දිනැති ලිපිය මඟින් විමසීමක් කරන ලදී. නමුත් එයට පිළිතුරක් නොලද අතර, 1 වන සිහිකැඳවීම් ලිපිය 2025.09.08 දිනැතිව යොමු කළද, එයටද මසකට අධික කාලයක් ගතවුවත් අපේක්ෂිත පිළිතුර නොලද බැවින් 2025.10.30 දින වාර්තාව සමඟ පුද්ගලිකව පෙනීසිටීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා කැඳවීමට කටයුතු කරන ලදී. එම තීරණය දැන්වීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් අදාළ වාර්තාව 2025.10.30 දිනට ප්‍රථම මා වෙත ලැබීමට සළස්වන ලද අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අංක UGC/CH/7/1/4 සහ 2025.10.15 දිනැති ලිපිය මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ස්වාධීන බාහිර පරීක්ෂකවරුන් තිදෙනෙකු විසින් පැමිණිලිකාරියගේ ප්‍රශ්න පත්‍ර නැවත ඇගයීම සිදුකරන ලද බවත්, ඔවුන්ගේ නිර්දේශ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව කොමිෂන් සභාවේ නිර්දේශය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අංක UGC/AC/10/kln-I iy සහ 2025.09.22 දිනැති ලිපිය මඟින් පැමිණිලිකාරිය වෙතද යොමුකර ඇති බව දන්වා එවන ලදී.

ඒ අනුව අපගේ මැදිහත්වීමෙන් පසු අවසන් වසර අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කිරීමට පිළිතුරුපත් බාහිර අධීක්ෂකවරයෙකු යටතේ නැවත පරීක්ෂා කිරීමට පැමිණිලිකාරිය විසින් සිදුකළ ඉල්ලීම ඉටුකරගත හැකි විය.

අංකය : OMB /P/2/4/5490/2023 **එම්.ජී. ශ්‍රියාණි මිය**

වලස්මුල්ල, කලාප 02, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයෙහි ආර්ථික සහකාර ලෙස සේවය කරන එම්.ජී. ශ්‍රියාණි මිය විසින් 2023.06.15 දිනැතිව මා වෙත පැමිණිල්ලක් යොමු කරමින් දන්වා ඇත්තේ, උපාධිධාරී අභ්‍යාසලාභීන්ට ස්ථිර තනතුරු ලබාදීමේදී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් දකුණු පළාත් රාජ්‍ය සේවයේ, දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආර්ථික සහකාර තනතුර සඳහා 1997.02.17 දින සිට බඳවාගත් බවත්, එසේම බඳවාගත් දිනයේ සිට MN – 6 වැටුප් කේතය අනුව වැටුප් ගෙවීම් සිදුකරන බවත් පැමිණිලිකාරියගේ වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව පරිවර්තනය කිරීම මෙතෙක් සිදු කර නොමැති බැවින් එම චක්‍රලේඛය ප්‍රකාරව වැටුප සකස් කර දෙන ලෙසයි.

ඒ අනුව දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙතින් වාර්තාවක් කැඳවන ලදී. දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක SP/DOA/1/2/2/352 සහ 2023.08.10 දිනැති වාර්තාව මඟින් දක්වා ඇත්තේ, දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් අංක ආ/2/5/1 සහ 2023.05.31 දිනැති ලිපිය මඟින් පැමිණිලිකාරියගේ වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි MN – 06/2016 අනුව සංශෝධනය කිරීම සුදුසු බව නිර්දේශ කර

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවයි. මේ පිළිබඳව 2023.08.18 දින, උක්ත වාර්තාවේ පිටපතක්ද සමඟ පැමිණිලිකාරිය වෙත දන්වන ලදී. නමුත් පැමිණිලිකාරිය විසින් ඇයගේ ගැටළුව මෙතෙක් විසඳී නොමැති බව දන්වා 2024.10.30 දිනැතිව නැවතත් ලිපියක් මා වෙත යොමුකරන ලදී. ඒ අනුව, නැවතත් 2024.11.22 දිනැති ලිපිය මඟින් දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙතින් ගැටළුව සම්බන්ධව ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා යවන ලදී. එයට පිළිතුර ලෙස අංක SP/DOA/1/2/2/352 සහ 2024.12.10 දිනැති ලිපිය මඟින් පැමිණිලිකාරියට ගෙවිය යුතු වැටුප් කේතය සම්බන්ධව පැහැදිලි නිර්දේශයක් ඉදිරිපත් කර නොමැති බව දන්වන ලද බැවින් මෙම ගැටළුව සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් 2024.12.23 දිනැතිව වාර්තාවක් සහ 2025.04.28 දිනැතිව ප්‍රගතිය දැක්වූ වාර්තාවක් කැඳවීමට තීරණය කරන ලදී. ඒ අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/SP/0309 හා 2025.01.31 දිනැති ලිපිය මඟින් දරන්නාට පෞද්ගලික වන සේ ආර්ථික සහයක තනතුරෙහි වැටුප් කේතය MN6 ලෙස සංශෝධනය කර ඉදිරි කටයුතු සිදුකරන ලෙස දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත දැනුම් දී ඇති බව මා වෙත වාර්තා කරන ලදී.

ඒ අනුව දීර්ඝ කාලයක් තිස්සේ පැමිණිලිකාරියගේ තනතුරට හිමි වැටුප් පරිමාණය තීරණය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට නොහැකිව තිබූ අනුමැතිය අපගේ මැදිහත්වීමෙන් පසු වසර එකහමාරක් (1 ½) වැනි කාලයක් තුළ ලබාගැනීමට හැකිවීම හේතුවෙන් පැමිණිලිකාරියගේ ඉල්ලීම ඉටුකරගැනීමට හැකිවිය.

අංකය : OMB/P/2/5/4805/2024 **වෛද්‍ය විශ්ම සජිත් ඕපාත මහතා**

පැමිණිලිකරු වන කළුතර ශික්ෂණ රෝහලේ වෛද්‍යවරයෙකු වන 130 A/1,වටරවුම් පාර,පොතුපිටිය,වාද්දුව ලිපිනයේ පදිංචි විශ්ම සජිත් ඕපාත මහතා කළුතර ශික්ෂණ රෝහලට තාවකාලික ස්ථාන මාරුවක් ලබා පැමිණ ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ තෘතික සේවා අංශයේ දීර්ඝ කාලයක් තිස්සේ වෛද්‍යවරුන්ගේ වැටුප් වර්ධක හා වැටුප් සැකසීමට ලිපිකාරිනියක් නොමැති වීම හේතුවෙන් වැටුප් වර්ධක සැකසීම හා ගෙවීම් ඇතුළු රාජකාරී කටයුතු අකාර්යක්ෂමතාවයට පත්වීම සම්බන්ධයෙන් 2024.12.21 වන දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ කඩිනමින් ඔහුගේ වැටුප් වර්ධක ලබාදී පෞද්ගලික ලිපි ගොනුව නව සේවා ස්ථානයට යොමු කිරීමට කටයුතු කරදෙන ලෙසයි.

මෙම ගැටළුව සම්බන්ධයෙන් සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙතින් 2025/01/21 දිනැතිව වාර්තාවක් කැඳවන ලදී.එම ලිපියට ප්‍රතිචාරයක් නොලද බැවින් 2025/03/03 දිනැතිව 1 වන සිහිකැඳවීම යොමු කරන ලද අතර එයට ප්‍රතිචාරයක් වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වෙතින් 2025/03/19 දිනැතිව වාර්තාවක් එවා තිබුණි.ඒ අනුව පැමිණිලිකරුගේ පෞද්ගලික ලිපිගොනුව නව සේවා ස්ථානය වන කළුතර ශික්ෂණ රෝහල වෙත යවන ලද බව එමගින් දන්වා ඇත.ඒ අනුව ඔහුගේ වැටුප් වර්ධක සැකසීම හා ගෙවීම් සිදුකිරීම නිසි ආකාරව

සිදුකිරීම සම්බන්ධව පැමිණිලිකරුගේ ඉල්ලීම අප ආයතනයේ මැදිහත් වීමෙන් ඉටු කිරීමට හැකියාව ලැබිණි.

තම ඉල්ලීම ඉටු කිරීමට අවශ්‍ය කටයුතු සලසාදීම සම්බන්ධයෙන් මැදිහත් වී කටයුතු කල කොමසාරිස්තුමා ඇතුලු කාර්ය මණ්ඩලයට ස්තූති කරමින් 2025/04/10 දිනැතිව ලිපියක්ද පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර තිබුණි.

අංකය : OMB/P/2/6/3893/2024 **එම්.ජී.පී.මුදිතානන්ද මහතා,**

ඉල්ලුම්කරු වන මාතර පදිංචි එම්.ජී.පී.මුදිතානන්ද මහතා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි සේවය කරන අතර, එම අය විසින් 2024 වර්ෂයේදී සිදු කළ අතිකාල සේවා සඳහා ගෙවීම් කිරීමට තිබූ මුදලක් එකී ආයතනයේ පර්යන්ත කළමණාකර විසින් නිකුත් කරන ලද ලිපියක් ආශ්‍රය කොට ගෙන කපා හැර තිබෙන බවත්, එම ලිපිය නිකුත් කර ඇත්තේ ඉල්ලුම්කරු ඇතුළු සේවක පිරිස් අතිකාල සේවා ඉටු කිරීමෙන් අනතුරුව බවත් 2024/12/24 දිනැතිව එවා ඇති පෙත්සමෙහි සඳහන් කර ඇත.

ඒ අනුව මෙම ගැටලුව සම්බන්ධයෙන් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වෙතින් 2025/01/06 දිනැතිව වාර්තාවක් කැඳවන ලදී.

එකී ලිපියට අනුව, එම ආයතනය විසින් 2025/01/15 දිනැතිව වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර එහි සඳහන් වූ පරිදි එම ආයතනයෙන් නිකුත් කළ 2018/05/14 දිනැති 024-595 චක්‍රෙල්ඛය අනුව සියළුම සේවකයන්ගේ මාසික අතිකාල එකතුව ඔවුන්ගේ මූලික වැටුප නොඉක්ම වියයුතු බවයි. එපරිදි එම්.ජී.පී.මුදිතානන්ද මහතාගේ 2024 දෙසැම්බර් මාසයට අදාළව ඉල්ලා ඇති රු.71,741.93ක මුදල නොගෙවූ බවයි.

නමුත් වාරතාවේ කරුණු අනුව 2024 වර්ෂයේ මුල සිටම එම චක්‍රලේඛය ක්‍රියාත්මක කළ යුතුව තිබූ නමුත් එම චක්‍ර ලේඛය ක්‍රියාත්මක වී ඇත්තේ 2024/12/16 දින සිට බව පෙනී ගිය හෙයින්, මෙසේ ප්‍රමාද වී අදාළ චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමට හේතු විමසා නැවත සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයට 2025/02/05 දිනැතිව කොමසාරිස්තුමා විසින් ලිපියක් යොමු කර අමතර කරුණු විමසීමක් කරන ලදී. එසේම මෙම වාර්තාව සම්බන්ධයෙන් සහ නැවත විමසීම් කරන ලද ලිපිය සම්බන්ධයෙන් කරුණු ඇතුළත් කොට ඉල්ලුම්කරුට ද 2025.02.24 දිනැතිව ලිපියක් යොමු කරන ලදී.

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය වෙත යොමු කළ 2025/02/05 දිනැතති ලිපියට පිළිතුරු නොලද හෙයින් නැවතත් 2025/02/20 දින පළමුවැනි සිහිපත් කිරීම එම ආයතනය වෙත යවන ලදී. ඊටත් පිළිතුරු දැක්වීමට ඔවුන් අපොහොසත් වූ බැවින් එම ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) හට මේ සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් සමග 2025/07/02 දින පෞද්ගලිකව පෙනී සිටීමට කොමසාරිස්තුමා නියෝග කරන ලදී.

එසේ පෞද්ගලිකව පෙනී සිටීමට නියෝග කළ දිනට පෙර දින මෙකී ආයතනය විසින් කොමසාරිස්තුමා වෙත අදාළ වාර්තාව ඉදිරිපත් කරන ලද අතර එමගින් ඔවුන් දන්වා ඇත්තේ ඔවුන් විසින්, පෙර නිකුත් කළ චක්‍රලේඛය ක්‍රියාත්මක වී ඇත්තේ 2024/12/11 දිනැති ලිපිය අනුව බවයි. කරුණු එසේ හෙයින් මෙම ඉල්ලුම්කරුගේ අතිකාල සේවය වෙනුවෙන් ඉල්ලා සිටින මුදල ගෙවීමට කටයුතු කරන බවයි.

ඒ අනුව, එම්.ජී.පී.මුදිතානන්ද මහතාගේ ඉල්ලීම වන ඔහු විසින් සිදු කළ අතිකාල සේවයට අදාළව ගෙවීමට නියමිත ව තිබූ රු.71,741.93ක මුදල එකවර, එම ආයතනය විසින් ගෙවීමට කටයුතු කර තිබීම හේතුවෙන් ඒ සඳහා මැදිහත්ව එකී මුදල ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දුන් කොමසාරිස්තුමා හා කාර්ය මණ්ඩලයට තම ගෞරව පූර්වක ස්තූතිය පල කර 2025/07/07 දිනැතිව ලිපියක් ද යොමු කර ඇත.

අංකය : OMB/P/2/6/3915/2025 බී.එම්.ඒ.පී.රවිනාත් මහතා, අනුරාධපුරය.

පැමිණිලිකරු වන කිරිබත්ගොඩ මූලික රෝහලේ ඖෂධවේදියකු ලෙස සේවය කරන බී.එම්.ඒ.පී.රවිනාත් මහතා බස්නාහිර පලාත තුළ නියමිත කාල සීමාවලදී පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවන්වල උසස්වීම් නිසි පරිදි නොකිරීම හේතුවෙන් කාර්යක්ෂමතා කඩයිම් විභාග සඳහා පැමිණිලිකරුට ඉදිරිපත් වීමට නොහැකි වී ඇති බව දක්වමින් 2025/02/25 දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී.

මෙම ගැටළුව සම්බන්ධයෙන් කොමසාරිස්තුමාගේ වාචික උපදෙස් පරිදි බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් 2025/03/17 දිනැතිව වාර්තාවක් කැඳවන ලදී. ඒ අනුව පැමිණිලිකරු සේවය කරන ලද කිරිබත්ගොඩ මූලික රෝහල සහ ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය අතර ද ලිපි හා වාර්තා මෙම ගැටළුව සම්බන්ධයෙන් හුවමාරු කර ගනිමින් අවසානයේ බී.එම්.ඒ.පී.රවිනාත් මහතා III ශ්‍රේණියේ සිට II ශ්‍රේණිය දක්වා උසස් කිරීමට කටයුතු කිරීමට අදාළ ලිපියක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025/03/10 දිනැතිව නිකුත් කර ඇති බවට ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යවන ලද ලිපියක පිටපතක් කිරිබත්ගොඩ මූලික රෝහල මගින් මා වෙත ඇත එවා තිබුණි. පැමිණිලිකරුගේ ඉල්ලීම අප ආයතනයේ මැදිහත්වීමෙන් ඉටු කිරීමට හැකියාව ලැබිණි.

තම ඉල්ලීම ඉටු වීමට අවශ්‍ය කටයුතු සලසා ඒ සම්බන්ධයෙන් මැදිහත්වී කටයුතු කළ කොමසාරිස්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූති කරමින් 2025/07/28 දිනැතිව ලිපියක් ද පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර තිබුණි.

නාරම්මල, ගනේගොඩ, තලගහයාය ලිපිනයෙහි පදිංචි ඒ.පී.එස්.ඩී.අබේනායක මහතා විසින් 2022.12.29 දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, පැමිණිලකරු ලියාපදිංචි ආදේශක වශයෙන් 1985.12.07 දින සේවයට බැඳී, 1992.08.20 දින ස්ථිර විශ්‍රාම වැටුප් තනතුරකට පත්වී ඇති බවයි. පසුව අවුරුදු 60 සම්පූර්ණවී 2019.03.11දින විශ්‍රාම ගැන්වීම සිදු කර ඇතත්, පැමිණිලිකරුගේ ආදේශක සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා යොදාගෙන නොමැති බවයි.

එකී පෙත්සම සම්බන්ධයෙන් තැපැල්පති වෙතින් වාර්තා කැඳවන ලදී. ඒ අනුව වාර්තාව යොමු කරමින් දන්වා ඇත්තේ, ආදේශක සේවා කාලය සමඟ සම්පූර්ණ සේවා කාලය වසර 33 මාස 03 දින 04 වුවත් අදේශක සේවා කාලයට අදාල චර්යා සටහන් නොමැතිවීම හේතුවෙන් විශ්‍රාම ගැන්වීමේ කටයුතු සඳහා අවුරුදු 26 මාස 06 දින 21 ලෙස ගණනය කර ඇති බවයි. කෙසේ නමුත්, මෙම පැමිණිලිකරු ආදේශක සේවා කාලයේදී අඛණ්ඩව සේවය කල බව සනාථ කිරීම සඳහා ඔහු සමඟ සේවය කරන ලද සමකාලීනයන් දෙදෙනෙකුගේ විස්තර ඉදිරිපත් කරන ලෙස පැමිණිලිකරු වෙත දැන්වීමෙන් පසුව ඔහු විසින් නම් කරන ලද එම කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව ත්‍රිපුද්ගල කමිටුවක් මගින් තොරතුරු සසඳා බැලීමෙන් අනතුරුව පැමිණිලිකරු 1985.12.06 සිට සේවයේ යෙදී සිට ඇති බව තහවුරුවූ බවත්, පසුව විශ්‍රාම වැටුප සඳහා ආදේශක සේවා කාලය ගණය වියුතු බැවින්, කමිටු වාර්තාව අනුමැතිය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවයි.

පසුව මේ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් කරන ලද විමසීමට අනුව, 1985.12.07 සිට 1992.08.19 දක්වා වූ කාලයෙන් 2/3 ක සේවා කාලයක් එකතු කිරීම සඳහා අනුමැතිය ලබාදුන් බව දන්වන ලදී. පසුව ඒ සම්බන්ධයෙන් තැපැල් දෙපාර්තමේන්තුව වෙතින් විමසීමෙන් අනතුරුව වාර්තාව යොමු කරමින් දන්වා ඇත්තේ, 1985.12.07 දින සිට 1992.08.19 දින දක්වා වූ කාලයෙන් 2/3 කාලයක් සඳහා “ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 (සංශෝධන 1) අනුව වැන්දඹු අනත්දරු දායක මුදල් ගණනය කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය” යන කොන්දේසියට යටත්ව විශ්‍රාම වැටුප ගණනය කිරීමට අනුමැතිය ලැබී ඇති බවයි. ඒ අනුව සියළු ලේඛණ සකස් කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවයි.

ඒ අනුව නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් විමසීමේදී දන්වා ඇත්තේ, විශ්‍රාම වැටුප් සංශෝධනයට අදාළ පීඩී06 අයදුම්පත අඩුපාඩු සහිතව ඉදිරිපත් කර ඇති බැවින් , එය නිවැරදි කර එවන ලෙස දන්වූවද අදාළ ආයතනය මගින් පිළිතුරු යොමු කර නොමැති බවයි. ඒ අනුව තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල්පති වෙතින් නැවත වාර්තා කැඳවන ලදී. ඒ අනුව පිළිතුරු යොමු කරමින්, නිලධාරියාගේ එකතු කල සේවා කාලය සඳහා පළමු පත්වීම් ලිපිය ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බවයි. ඒ අනුව, අදාළ නිලධාරියාගේ ආදේශක චර්යා සටහන් නොමැති විම හේතුවෙන් සමකාලීන සේවක මහතුන් දෙදෙනෙකුගේ චර්යා සටහන් ඉදිරිපත් කර, එම චර්යා

සටහන් පදනම් කර ගනිමින් එම නිලධාරියාගේ විශ්‍රාම වැටුප් සකස් කිරීම සඳහා මාර්ගගත පද්ධතිය ඔස්සේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවයි. කෙසේ නමුත්, මෙම විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා සියළු ලේඛණ ඉදිරිපත් කර තිබියදීත් අදාළ නිලධාරියාගේ පළමු පත්වීම් ලිපිය යොමු කරන ලෙස අදාළ ආයතනය වෙත ඉල්ලීමක් කර තිබීම හා පැමිණිලිකරුගේ ගැටළුවට සහනයක් ලබානොදී ලිපි හුවමාරු කරමින්, කල්ගත කිරීමක් පමණක් සිදු කරන බව පැහැදිලි වූ බැවින්, පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කඩිනමින් සිදුකර ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා මා විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වන ලදී.

පසුව, පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම වෙනුවෙන් එවා ඇති පීඩී06 අයදුම්පත මාර්ගගත ක්‍රමය ඔස්සේ අනුමත කර ඇති බවත්, ඒ අනුව ජුනි මස සිට සංශෝධිත වැටුපේ පිහිටුවා ඇති බවත්, ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා සංශෝධිත භාණ්ඩාගාර 79 නිකුත් කර විශ්‍රාමිකයා විශ්‍රාම වැටුප් ලබාගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතු බවයි. ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් AR පත්‍රය යොමු කළ පසු ඉදිරි කටයුතු සිදු කල හැකි බව දන්වා සිටින ලදී. පසුව සංශෝධිත විශ්‍රාම වැටුප මෙම පැමිණිලිකරු වෙත ලබාදුන් බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් යොමු කරන ලද AR පත්‍රය අනුව හිඟ වැටුප්ද ලබාදුන් බවත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් දන්වන ලදී.

පසුව පැමිණිලිකරු විසින් ලිපියක් යොමු කරමින් දන්වා ඇත්තේ, අප ආයතනය මැදිහත් වීම හේතුවෙන් ආදේශක සේවා කාලය ඇතුලත් කර විශ්‍රාම වැටුප ලබා ගැනීමටත්,එයට අදාල හිඟ මුදල් ලබා ගැනීම හැකිවූ බවත්, ඒ සම්බන්ධයෙන් ස්තූතිය පිරිනමන බවත් ය.

අංකය : OMB/P/2/7/1419/2024 **බී. නිහාල් චන්ද්‍රසිරි මහතා**

හිඟුරක්ගොඩ, සිංහගම, අළුත්ඔය, අංක 250 ලිපිනයෙහි පදිංචි බී. නිහාල් චන්ද්‍රසිරි මහතා විසින් 2024.08.25 දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, පැමිණිලිකරු ශ්‍රී ලංකා යුධ හමුදා ස්වේච්ඡා බල සේනාවේ වසර 16 මාස 11 සේවය කර ඇති බවත්, සේවයේ යෙදී සිටියදී සිදුවූ අනතුරක් හේතුවෙන් 2023.12.01 දින සේවයෙන් විශ්‍රාම ලබා ඇති බවයි . එසේ සිදුවූ අනතුර හේතුවෙන් ඉතාමත් අසරණ තත්ත්වය පත්ව ඇති බවත්, ජීවත්වීමට වෙනත් කිසිදු අදායම් මාර්ගයක් නොමැති හෙයින් විශ්‍රාම වැටුප සකස් කර දෙන ලෙසයි.

එකී පෙත්සම සම්බන්ධයෙන් යුධ හමුදාපති වෙතින් හා **ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ මේජර් (කා.නි.අදෙන නිලධාරී), වෙතින්** වාර්තා කැඳවන ලදී. ඒ අනුව **ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ මේජර් (කා.නි.අදෙන නිලධාරී)**වාර්තාව යොමු කරමින් දන්වා ඇත්තේ, පැමිණිලිකරු වෛද්‍ය හේතූන් මත 2022.09.29 දිනැතිව යුධ හමුදා සේවයෙන් ඉවත් කිරීමට නිර්දේශ කර ඇති බවයි. ඒ අනුව සියළු වරප්‍රසාද සහිතව හා විශ්‍රාම වැටුප් සහිතව යුධ හමුදාවෙන්

ඉවත් කිරීමට කටයුතු කර ඇති බවයි. ඒ බව පැමිණිලිකරු දැනුවත් කර ඇති මුත්, වසර 22 ක සේවා කාලයක් නිමවන තෙක් සේවය කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවයි. ඒ අනුව අස්කිරීම් කටයුතු සම්බන්ධව ගැටළු නිරාකරණය කොට අස්කිරීම් සඳහා යම් කාලයක් ගතවී ඇති අතර, අස්කිරීම් සඳහා වන ලියකියවිලි යොමු කිරීමේදී පැමිණිලිකරුගේ සේවා කාලය වසර 12 ක් සම්පූර්ණ කිරීමත් යන කරුණු හේතුවෙන් විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති බැවින්, විශ්‍රාම ගොනුව නැවත සකස් කර 2023.11.03 දින විශ්‍රාම ගන්වනු ලබන දිනය ලෙස සඳහන් කර ඇතත්, හිඟ දීමනා/දුබලතා දීමනා/විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සකස් කර 2024.06.16 දින ඉදිරිපත් කර ඇති බවයි.

නමුත්, විශ්‍රාම ගොනුවේ විශ්‍රාම ගැන්වනු ලබන දිනය 2023.12.01 වශයෙන් සඳහන්ව තිබුණද, වෛද්‍ය හේතුන් මත සෙසු නිලයෙකු අස්කිරීමේදී සෙබළ සේවා රෙගුලාසි මාලාවේ 84 ප්‍රකාරව ලබාදී ඇති උපදෙස් අනුව වෛද්‍ය මණ්ඩල අනුමත දින සිට දින 28 තුල අස්කිරීමේ කටයුතු සිදුකළ යුතු බවයි. 2022.10.27 දින සියළු දීමනා සහිතව විශ්‍රාම ගැන්වීමට කටයුතු කළ යුතු වුවත්, අස්කිරීම් කටයුතු සිදු නොකට 2023 ඔක්තෝම්බර් මස දක්වා වැටුප් හා දීමනා ලබාගෙන ඇති බැවින්, ඉහත දින වනවිට විශ්‍රාම ගැන්වීමේ කටයුතු සිදුකිරීමේ ගැටළු සහගත තත්ත්වයක් මතුව ඇති බවයි. 2022.10.27 දින අස්කිරිමට නිර්දේශය ලැබී තිබුණද, 2023 ඔක්තෝම්බර් මස දක්වා සේවයේ රැදී සිටිමින් වැටුප් හා දීමනා ලබා ඇති බැවින්, එම වැටුප් හා දීමනා අයකර ගන්නා ලෙස දැන්වුවද, එම මුදල ගෙවා ගැනීමට හැකියාවක් පැමිණිලිකරු වෙත නොමැති බැවින්, නැවත සේවයේ පිහිටුවා ඒකකය තුළ පොදු රාජකාරී සඳහා යෙදවීමට හැකියාවක් ඇති බව වැඩිදුරටත් දන්වා තිබුණි. කරුණු එසේ හෙයින් අස්කිරීමට කටයුතු සිදු නොකොට 2023 ඔක්තෝම්බර් මස දක්වා සේවයේ රැදී සිටිමින් වැටුප් හා දීමනා ලබා ඇති බැවින්, ඉහත දක්වා ඇති දිනට විශ්‍රාම ගැන්වීමේ කටයුතු සිදු කිරීමේදී ගැටළුකාරී තත්වයක් මතුව ඇති බැවින් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බවයි. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් පනාගොඩ යුද්ධ හමුදා ජනපදය වෙතින් වාර්තාවක් කැඳවා ඇති බව දන්වා තිබුනි.

පසුව ඒ සම්බන්ධයෙන් නැවත විමසීමෙන් අනතුරුව වාර්තාව යොමු කරමින් දන්වා සිටියේ 2025 අප්‍රේල් මස සිට විශ්‍රාම වැටුප් හිමිගන්වා ඇති බවයි. එයට අදාලව පැමිණිලිකරුගේ අදහස් විමසන ලදී. ඒ අනුව ඔහු විසින් මෙතෙක් ඔහුට අඩ විශ්‍රාම වැටුපක් පමණක් ලැබෙන බවත්, තමාට හිමි පූර්ණ වැටුප, ආබාධිත දීමනාව හා රජය විසින් වැඩිකරන ලද වැටුප් ලබාදී නොමැති බවට කරුණු ඉදිරිපත් කර සිටින ලදී.

ඒ අනුව නැවත් කරන ලද විමසීමට අනුව ආබාධිත දීමනාව හා රජය විසින් වැඩි කරන ලද වැටුප් ලබාදීම සම්බන්ධයෙන් යුද්ධ හමුදා වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බවත්, අංක 726/11 හා 1992.08.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් උපදෙස් පරිදි සේවා කාලය මත පදනම්ව ඔහුට හිමිකම් වශයෙන් ඇති සේවා විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ සාමාන්‍ය ක්‍රියාපිළිවෙතට අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් හිමිගැන්වීමට කටයුතු කර ඇති බවයි. එසේම දුබලතා වැටුප සම්බන්ධයෙන් වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බවත්, එම දුබලතා වැටුපද පැමිණිලකරුගේ මාසික

විශ්‍රාම වැටුප සමඟ ඉදිරියේදී ලැබීමට අපේක්ෂිත බව දන්වා ඇත. ඒ අනුව රජය විසින් වැඩිකරන ලද වැටුප් හා දීමනා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බවත්, ඒ සම්බන්ධයෙන් යුද්ධ හමුදා වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ලියකියවිලි සහිතව සිදුකර බවත් වැඩිදුරටත් දන්වා තිබුණි. ඒ අනුව, අපගේ මැදිහත්වීම මත පැමිණිලිකරු වෙත නොලැබී තිබූ විශ්‍රාම වැටුප ලබා ගැනීමට හැකිවිය.

අංකය : OMB/P/2/9/1617/2024 **ඩී.එල්.සී. කුමාර මහතා**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර විගණන කොට්ඨාසයේ අභ්‍යන්තර විගණන සහකාර තනතුරක සේවය කළ ඩී.එල්.සී. කුමාර මහතා 2022.12.01 දින සිට 2024.11.30 දින දක්වා වසර 2 ක කාලයක් සඳහා වැටුප් රහිත අනුමත විදේශ නිවාඩු යටතේ කැනඩාවේ සේවය කරමින් සිටිය දී එකී නිවාඩු කාල සීමාව 2024.11.30 දිනෙන් අවසන් වී තිබිණි.

2022.06.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව රාජ්‍ය, සංස්ථා, මණ්ඩල සහ අධිකාරිවල සේවකයන් සඳහා මුලින් වසර 2 ක් හා අනතුරුව වසර 3 ක් වශයෙන් වසර 5 ක් සඳහා විදේශ නිවාඩු ලබා ගත හැකි වූ බැවින් රා/පරි.ව.ලේ 14/2022 අනුව කුමාර මහතා විදේශ නිවාඩු ලබාගෙන කොන්ත්‍රාත් ගිවිසුම් මත රැකියාවක නියැලී සිට ඇත. මුල් අදියරේ නිවාඩු වසර 2 අවසන් වීමට මාස 4 කට ප්‍රථම ඒ මහතා විසින් තවත් වසර 3 ක් සඳහා නිවාඩුව දීර්ඝ කරවා ගැනීමට විධිමත් ලෙස අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියට අවතීර්ණ වී නිවාඩු අනුමැතිය ලබා ගෙන තිබූ පසුබිමක කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් හෝ අභ්‍යන්තර චක්‍රලේඛයක ප්‍රතිපාදනයකින් තොරව නිවාඩු ඉල්ලුම් ලිපිගොනුව නිවාඩු ප්‍රදාන ලිපියක් නිකුත් නොකොට වසා ඇති බව ඒ මහතාට දැන ගන්නට ලැබී තිබේ.

ඒ අනුව කුමාර මහතා විසින් 2025.01.09 දිනැතිව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත ඕඑම්බී 01 ආකෘතිය මගින් විධිමත් පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් අවශ්‍ය සියලු අනුමැතීන් ලැබී තිබූ බැවින් ඔහුගේ නිවාඩුව ඉදිරි වසර 3 ක් දක්වා දීර්ඝ කර ගැනීමට මෙම ආයතනයෙන් සහනය ඉල්ලා සිටින ලදි.

ඒ අනුව වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ වෙතින් 2025.01.17 දිනැතිව වාර්තාවක් කැඳවන ලදි. නියමිත කාලය තුළ පිළිතුරු නොලැබුණු බැවින් 2025.03.12 දිනැතිව සිහි කැඳවීම් සිදු කර ඇත. කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් 2025.03.26 දිනැතිව ඊට පිළිතුරු ලබා දී ඇති අතර 2025.02.28 දින රැස් වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විදේශ රැකියා සහ අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු අනුමත කිරීම නැවත දැනුම් දෙන තෙක් තාවකාලිකව අත්හිටුවීමටත්, අදාළ කොන්දේසිවලට එකඟ වන්නේ නම් කුමාර මහතාගේ නිවාඩුව 2024.11.30 දිනෙන් පසුව තවත් එක් වසරක් සඳහා පමණක් දීර්ඝ කළ හැකි බවත් දන්වා තිබුණි.

අදාළ වාර්තාව පැමිණිලිකරු වෙත යොමු කර ඔහුගේ නිරීක්ෂණ ලබා ගැනීමට කටයුතු කරන ලදි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ගන්නා ලද 2025.02.28 දිනය දක්වා ස්වකීය නිවාඩු අයදුම්පත

සම්බන්ධයෙන් වූ සියලු ලිපිකාරමය කටයුතු චේතනාත්මක ලෙස නවත්වාගෙන සිට ඇති බව ද ඒ සම්බන්ධයෙන් කිසිදු සාධාරණ හේතු දැක්වීමක් කර නැති බව ද ඒ හේතුවෙන් තමන්ට අගතියක් සිදු වී ඇති බව ද පැමිණිලිකාර කුමාර මහතා විසින් දන්වන ලදි. එකී නිරීක්ෂණ වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ වෙත නැවත යොමු කර ඒ සම්බන්ධයෙන් ඔහු විසින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේ දැ යි විමසන ලදි. නියමිත කාලය තුළ ඊට පිළිතුරු ලබා දීමට කළමනාකාර අධ්‍යක්ෂවරයා අපොහොසත් වූ බැවින් 2025.07.16 දිනැතිව සිහි කැඳවීම් සිදු කරන ලදි.

ඒ අනුව කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් 2025.07.29 දිනැතිව ඊට පිළිතුරු ලබා දෙමින් ඉහත නිවාඩු අනුමැතිය පිළිබඳව සවිස්තර වාර්තාවක් සපයන ලදි. එසේම කුමාර මහතාගේ නිවාඩුව 2025.11.30 දින දක්වා තවත් එක වසරකින් දීර්ඝ කිරීමට තීරණය කරන ලද බව දන්වන ලදි.

එකී තීරණයට කුමාර මහතා එකඟ වන්නේ නම් සති 2 ක කාලයක් තුළ දැනුම් දෙන ලෙස දන්වන ලද අතර, එකී තීරණය සම්බන්ධයෙන් තමා අතෘප්තියට පත් වන බවත් ස්වකීය නිවාඩුව 2027.11.30 දක්වා සම්පූර්ණ වසර 5 ම ආවරණය වන පරිදි දීර්ඝ කර ගැනීම සඳහා මැදිහත් වන ලෙස කුමාර මහතා විසින් මෙම කාර්යාලයෙන් නැවත ඉල්ලීම් කරන ලදි.

ඒ අනුව ඉහත නිවාඩු අනුමැතිය ලබා ගැනීමට අදාළ වැදගත් කරුණු විස්තරාත්මක ලෙස දක්වමින් අදාළ නිර්දේශ ද සහිතව 2025.09.04 දිනැතිව වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂවරයා වෙත ලිපි යොමු කරන ලද අතර ඔහු විසින් ගැනීමට අපේක්ෂිත ඉදිරි පියවර සම්බන්ධයෙන් සති 2 ක් තුළ ඔම්බුඩ්ස්මන්වරයා දැනුවත් කරන මෙන් දන්වන ලදි.

කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ 2025.11.15 දිනැති ලිපිය මගින් කුමාර මහතා විසින් ඉල්ලා සිටි පරිදි සම්පූර්ණ නිවාඩු කාලයම ආවරණය වන පරිදි අදාළ නිවාඩුව 2027.11.30 දින දක්වා දීර්ඝ කරන ලද බව දන්වන ලදි. ඒ අනුව පැමිණිලිකරු විසින් මෙම ආයතනයෙන් අපේක්ෂා කරන ලද සහනය ලැබී තිබූ බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන බව 2025.12.29 දිනැතිව කළමනාකාර අධ්‍යක්ෂවරයාටද පිටපත් සහිතව පැමිණිලිකාර කුමාර මහතා වෙත ලිපි යොමුකරමින් දන්වන ලදි.

ගොනු අංකය : OMB/P/2/9/1498/2024 ජී. සමන්ති ද සිල්වා මහත්මිය

සවුදි අරාබියේ සේවා ආයතනයක වෙනත් අයකුගේ නමින් තමා සේවයේ යෙදවීම, ඒ ගැන විමසූ විට හේතු නොදන්වා සේවයෙන් ඉවත් කර නේවාසිකාගාරයේ රඳවා තැබීම හා එම කාලයට වැටුප් නොගෙවීම හා ඒ හේතුවෙන් සිදු වූ සිත්තැවුල සම්බන්ධයෙන් මෙරට විදේශ රැකියා ඒජන්සිය නිසි මැදිහත්වීමක් නොකිරීම හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයට කරන ලද පැමිණිල්ල සාධාරණ පරීක්ෂණයකින් තොරව අවසන් කළ බවත් ජී. සමන්ති ද සිල්වා මහත්මිය 2024.05.07 දිනැති පැමිණිල්ලෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත දන්වා තිබිණි.

ඒ අනුව 2024.06.18 දිනැතිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති වෙතින් වාර්තාවක් කැඳවන ලදි. සභාපති විසින් 2024.08.15 දිනැතිව ලබා දුන් පිළිතුරු සම්බන්ධයෙන් මෙම කාර්යාලය සෑහීමට පත් නොවූ අතර විදේශ ශ්‍රමිකයකුට අයුක්තියක් සිදු වූ විට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ස්වාභාවික යුක්තියේ මූලධර්මවලට අනුව දෙපාර්ශ්වය කැඳවා පරීක්ෂණයක් සිදු කර නොමැති බව ද ඒ අනුව සමන්ති මහත්මියට ගෙවන ලද වැටුප් විස්තර හා පැමිණිල්ල මෙහෙයවන ලද නිලධාරීන් පිළිබඳ විස්තර සහ ඔවුන් විසින් ලබා දෙන ලද අවසන් වාර්තාවේ පිටපත් ආදිය ලබා ගන්නා ලදි.

තව ද පෙත්සම්කාර සමන්ති මහත්මිය සහ වග උත්තරකාර සාමාන්‍යාධිකාරී , ශ්‍රී ලංකා විදේශ සේවා නියුත්කි කාර්යංශය යන අය 2025.01.28 දින ඔම්බුඩ්ස්මන් කාර්යාලයට කැඳවා පරීක්ෂණයක් සිදු කරන ලදි. රාජ්‍ය ආයතනයක් ලෙස රටට විදේශ විනිමය ගෙන දෙන විදෙස්ගත ලාංකික ශ්‍රමිකයන් මුහුණ දෙන ගැටළු සහ ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වඩාත් සැළකිලිමත් විය යුතු බව කොමසාරිස්තුමා විසින් අවධාරණය කරන ලද අතර අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් සියලු පාර්ශ්ව කැඳවා සාධාරණ පරීක්ෂණයක් පවත්වා මාස 3 ක් ඇතුළත වාර්තා කරන ලෙස නිර්දේශ කරන ලදි.

ඉන් පසු සිදු කරන ලද සිහි කැඳවීම් හා පසු විපරම්වලින් අනතුරුව ඉහත කරුණු සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලද බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමථ) විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත 2025.09.30 දිනැතිව දන්වා එවීය. ඒ අනුව සමන්ති මහත්මියට නොගෙවන ලද මාස 4 ක හිඟ වැටුප වූ රු. 319,400 ක මුදල ඇයට ගෙවීමට ඇය විදේශගත වීමට මැදිහත්වීම් කළ ඒජන්සි ආයතනයට විධානය කළ බව දන්වන ලදි.

ඒ අනුව අදාළ ඒජන්සි ආයතනය විසින් අදාළ හිඟ වැටුප දෙවරක දී සමන්ති මහත්මිය වෙත ගෙවා නිම කිරීමට එකඟතාව පළ කර තිබුණි. සමන්ති මහත්මිය විසින් 2025.11.13 දිනැතිව මෙම කාර්යාලයට ස්තුති කිරීමේ ලිපියක් යොමු කරමින් ඇයගේ හිඟ වැටුප් 2025.10.11 දිනැතිව අදාළ ඒජන්සි ආයතනය විසින් ගෙවා නිම කරන ලද බව දැනුම් දී තිබුණි. පැමිණිලිකරු විසින් මෙම ආයතනයෙන් අපේක්ෂා කරන ලද සහනය ලැබී ඇති බැවින් 2025.11.18 දිනෙන් යුතුව අදාළ OMB/P/2/9/1498/2024 ගොනුව වසා දැමීමට කටයුතු කරන ලදි.

<u>පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම</u>

2.සංඛ්‍යානමය විශ්ලේෂණ

2.1 සංඛ්‍යානමය විශ්ලේෂණය

2025 වසර තුලදී විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව මගින් යොමු නොවූ අතර මහජනතාවගෙන් සෘජුව පැමිණිලි 1628 ක් මෙම කාර්යාලය වෙත ලැබී ඇත. එම පැමිණිලි 1628 අතරින් පැමිණිලි 773 ක්ම ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල යටතට නොවැටේ. 2024 වසර අවසන් වන විට නිම කිරීමට නොහැකිව ඉදිරියට ගෙන ආ පැමිණිලි 885ක වැඩකටයුතු ද අවසන් කිරීමට නියමිතව තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුල කටයුතු කිරීම සඳහා පැමිණිලි **2513**ක් පැවතිණි.

වගුව : 1 සංඛ්‍යානමය විශ්ලේෂණය 2025 වර්ෂය

		අවසන් නොවූ	අවසන්	එකතුව
	2024 වර්ෂය අවසානයේ ඉතිරිව පැවති, පැමිණිලි සංඛ්‍යාව			885
(1)	**2025.01.01 සිට 2025.12.31 දක්වා ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව**			
(I)	සෘජුව ලැබුණු පැමිණිලි	1628		
(II)	මහජන පෙත්සම් කාරක සභාව මගින් යොමු කරන ලද පැමිණිලි	0		
(2)	2025 වර්ෂයේ ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව			1628
	2025 වර්ෂය තුල කටයුතු සිදු කිරීමට නියමිත මුළු පැමිණිලි වල එකතුව			**2513**

	2025 වර්ෂය තුල විමර්ශනය කරන ලද සමස්ත පැමිණිලි සංඛ්‍යාව			
(1)	ප්‍රාථමික අවධියේදී අවසන් වූ පැමිණිලි			
i	ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල යටතට නොවැටෙන පැමිණිලි		990	
ii	පැහැදිලි සහනයක් සඳහා ඉල්ලීම් නොකිරීම හේතුවෙන් අවධානය යොමු නොකරන ලද පැමිණිලි		41	1031
(2)	**අදාල ආයතන වෙතින් වාර්තා කැඳවීමෙන් පසු පරීක්ෂණයට භාජනය කරන ලද පැමිණිලි**			
i	පැමිණිල්ලේ කරුණු අනුව බැලූ බැල්මට ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම අවශ්‍යවීම හේතුවෙන් අදාල ආයතන වෙතින් වාර්තා කැඳවන ලද පැමිණිලි - අවසන් නැත	261		
ii	වාර්තා කැඳවීමෙන් පසු එහි සඳහන් කරුණු අනුව, තවදුරටත් එම ආයතනය මගින් හෝ වෙනත් පාර්ශව වෙතින් වාර්තා කැඳවන ලද පැමිණිලි - අවසන් නැත	168		
iii	පැමිණිලිකරුවන්ගෙන් තොරතුරු කැඳවා ඇති පැමිණිලි - අවසන් නැත	262		
iv	එකී වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලීම සාර්ථකව ඉටු වී ඇති පැමිණිලි		112	
v	වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලීම ප්‍රතික්ෂේප වූ පැමිණිලි		265	
vi	පැමිණිලිකරුවන් උනන්දුවක් නොදැක්වීම හේතුවෙන් කටයුතු අවසන් කරන ලද ගොනු		387	764
(3)	**වාර්තා කැඳවීමෙන් පමණක් තීරණයකට එළඹීමට අපහසු වීම හේතුවෙන්, දෙපාර්ශවය කැඳවා පරීක්ෂණ වලට භාජනය කරන ලද පැමිණිලි :-**			
i	වාර්තා කැඳවීමෙන් පසු පැමිණිලිකරුවන් හා වගඋත්තරකරුවන් කැඳවා තවදුරටත් පරීක්ෂණ පවත්වන ලද පැමිණිලි - අවසන් නැත	4		
ii	පරීක්ෂණ වලින් පසු ඉල්ලීම ප්‍රතික්ෂේප වන පැමිණිලි		4	
iii	පරීක්ෂණ වලින් පසු ඊට අදාලව නිර්දේශ නිකුත් කරන ලද පැමිණිලි - අවසන් නැත	4		
iv	නිර්දේශ ක්‍රියාත්මක වීමෙන් පසු පැමිණිලිකරුවන් වෙත සහන සැලසී ඇති පැමිණිලි		15	
v	දෙන ලද නිර්දේශ නොසලකා හැර ඇති පැමිණිලි			19
	(1)+(2)+(3) මුළු එකතුව			1814
	2025.12.31 දින වන විට ඉතිරි පැමිණිලි සංඛ්‍යාව			699

2.2 පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය

2025 වර්ෂයේදී කටයුතු කිරීමට නියමිතව තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 2513 ක් වූ අතර, ඉදිරි වර්ෂයට ගෙන යන ලද පැමිණිලි සංඛ්‍යාව 699 කි. ඒ අනුව, පැමිණිලි 1814 කටයුතු 2025 වර්ෂයේදී අවසන් කර ඇත. (වගුව:1 - සංඛ්‍යානමය විශ්ලේෂණය - 2025 වර්ෂය මගින් දැක්වූ පරිදි) එම පැමිණිලි සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශය පහත 1 වන ප්‍රස්තාරය මගින් දක්වා ඇත.

ප්‍රස්තාරය 1: 2025 වර්ෂයේදී පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය



පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය		පැමිණිලි සංඛ්‍යාව
	මැදිහත්විය නොහැකි පැමිණිලි	1031
	වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලිම ඉටු වූ පැමිණිලි	112
	පරීක්ෂණ පැවැත්වීමෙන් පසු ඉල්ලීම ඉටු වූ පැමිණිලි	15
	වාර්තා කැඳවීමෙන් පරීක්ෂණ පැවැත්වීමෙන් පසු ඉල්ලිම ප්‍රතික්ෂේප පැමිණිලි	656
	ඉදිරි වර්ෂයට කටයුතු කිරීමට ඉතිරි වූ පැමිණිලි	699
2025 වර්ෂය තුල කටයුතු සිදු කිරීමට නියමිතව තිබූ මුළු පැමිණිලි වල එකතුව		**2513**

2.3 මාසික විශ්ලේෂණය

2025 වසර තුලදී ලැබුණු මුළු පැමිණිලි 1628ක් විය. වැඩිම පැමිණිලි සංඛ්‍යාව වන 252ක් දෙසැම්බර් මාසය තුලදී හා අඩුම පැමිණිලි සංඛ්‍යාව වන 72ක් මැයි මාසයේ ඉදිරිපත් විය. අදාල විස්තර 2 වන ප්‍රස්තාරයේ පැහැදිලි කර ඇත.

ප්‍රස්තාරය: 2 – 2025 වර්ෂයේදී එක් එක් මස තුල ලද පැමිණිලි සංඛ්‍යාව



2.4 ස්ත්‍රී/පුරුෂ වශයෙන් ලද පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය

2025 වර්ෂය තුල ගොනු කරන ලද පැමිණිලි 1141 ක් පුරුෂ පාර්ශවය විසින් ද, 487ක් ස්ත්‍රී පාර්ශවය විසින් ද ඉදිරිපත් කර ඇත. 2 වන වගුවේ සහ 3 වන ප්‍රස්තාරයේ ඒවා විස්තර කර ඇත.

වගුව: 2 - 2025 වර්ෂයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් ලද මුළු පැමිණිලි සංඛ්‍යාව

මාසය	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ජනවාරි	92	42	134
පෙබරවාරි	64	37	101
මාර්තු	87	52	139
අප්‍රේල්	70	16	86
මැයි	52	20	72
ජූනි	65	37	102
ජූලි	121	53	174
අගෝස්තු	73	32	105
සැප්තැම්බර්	100	45	145
ඔක්තෝබර්	115	60	175
නොවැම්බර්	97	46	143
දෙසැම්බර්	205	47	252
එකතුව	**1141**	**487**	**1628**

ප්‍රස්තාරය: 3 – 2025 වර්ෂයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් ලද මුළු පැමිණිලි සංඛ්‍යාව



2.5 දිස්ත්‍රික්ක විශ්ලේෂණය

2025 වර්ෂය තුල වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වන අතර, එය 195 කි. අනතුරුව, වැඩිම පැමිණිලි සංඛ්‍යාව ලෙස ගාල්ල දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 156ක් ද, රත්නපුර දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 145 ක් ද ලැබුණි.

***ප්‍රස්තාරය: 4 -** පැමිණිලිකරුවන්ගේ නිත්‍ය පදිංචි දිස්ත්‍රික්කය අනුව කරන ලද වර්ගීකරණයට අනුව **2025** වර්ෂයේදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව*



2.6 විෂය විශ්ලේෂණය

2025 වර්ෂය තුල දී විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටලු, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගැටළු, වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල්, දීමනා, උසස්වීම් හා ජ්‍යෙෂ්ඨත්වය, ඉඩම් බලපත්‍ර, රජයේ ඉඩම් ප්‍රදාන, යනාදීය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් සැලකිය යුතු පැමිණිලි ප්‍රමාණයක් ලැබී තිබුණි. පහත 3 වන වගුව බලන්න.

*වගුව 3 : **2025** වර්ෂය තුළ විෂයානුගතව මහජන නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි මුළු සංඛ්‍යාව*

	විෂය	පැමිණිලි සංඛ්‍යාව 2025
1	විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප	153
2	ඉඩම් බලපත්‍ර, රජයේ ඉඩම් ප්‍රදානය	138
3	ප්‍රමාදය, නොහැකියාව, නොසලකා හැරීම, බලය අනිසි ලෙස භාවිත කිරීම	63
4	වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල්, දීමනා	40
5	අනවසර ඉදිකිරීම්/පීඩාවන්	39
6	උසස්වීම්, ජ්‍යෙෂ්ඨත්වය	25
7	සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික දීමනා	23
8	සේවා අන්තර්ග්‍රහණය කිරීම, බඳවා ගැනීම, පත්වීම, ස්ථිර කිරීම, පෙරදාතම් කිරීම	18
9	විශ්ව විද්‍යාල/පාසැල් වලට ඇතුලත් වීම, විභාග ප්‍රතිඵල	16
10	විවිධ	14
11	බලපත්‍ර, ගොඩනැගිලි අවසර පත්‍ර	11
12	සේවය අවසන් කිරීම, නැවත සේවයේ පිහිටුවීම, දීර්ඝ කිරීම, කාර්යක්ෂමතා කඩඉම්	10
13	මාර්ග පද්ධති	9
14	සේවා ස්ථානයෙන් මාරු කිරීම	8
15	සේවා ස්ථානයේ දී වන හිරිහැර	7
16	විදුලිය, ජලය, දුරකතන සම්බන්ධ කිරීම් හා විසංධි කිරීම	6
17	අස්වැසුම	6
18	වන්දි ගෙවීම, දුප්පතුන්ට සහනාධාර, සමෘද්ධි	4
19	අග්‍රහාර රක්ෂණය	4
20	ණය, අයකිරීම්, නැවත උපලේඛනගත කිරීම	3
21	මැදිහත් විය නොහැකි	1031
	මුළු ගණන	1628

2.7 අමාත්‍යාංශ/ මහජන ආයතන විශ්ලේෂණය

පහත වගුව නිරීක්ෂණය කිරීමේදී පෙනීයන්නේ, වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ ස්වදේශ කටයුතු අමාත්‍යාශයේ නිලධාරීන්ට එරෙහිව බවයි. පහත 4 වගුව බලන්න.

වගුව 4 :- අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි සහ රජයේ ආයතන වල නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි සංඛ්‍යාව

	අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී ආදී ...	**පැමිණිලි සංඛ්‍යාව 2025**
1	ස්වදේශ කටයුතු ; දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල	129
2	ආරක්ෂක සහ අභ්‍යන්තර ආරක්ෂක	77
3	පළාත් සභා හා පළාත් පාලන ආයතන	61
4	වාරිමාර්ග සහ මහවැලි අධිකාරිය	41
5	සංස්ථා, අධිකාරී,මණ්ඩල (CPC, CEB, SLAA, RDA,SLBC,SLRC,SLIC)	39
6	විවිධ ආයතන	35
7	රජයේ පාසල්	30
8	විශ්‍රාම වැටුප්	23
9	අධ්‍යාපන හා උසස් අධ්‍යාපන	19
10	ඉඩම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම	19
11	සමූපකාර සංවර්ධනය	13
12	රාජ්‍ය පරිපාලන	13
13	සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය	11
14	වන සංරක්ෂණ	11
15	රාජ්‍ය සේවා කොමිසම (මධ්‍යම සහ පළාත්)	8
16	අධිකරණ	8
17	කෘෂිකර්ම	7
18	කම්කරු දෙපාර්තමේන්තුව	7
19	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	6
20	රජයේ බැංකු	5
21	තැපැල් සහ විදුලි සංදේශ	5
22	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	4
23	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	4
24	ගමනාගමන (SLCTB, CGR, CMV)	3
25	විශ්ව විද්‍යාල	3
26	නාගරික සංවර්ධන අධිකාරිය	3
27	ජාතික තරුණ සේවා සභාව	3
28	සමාජ සේවා හා සමෘද්ධි	2
29	සුරාබදු දෙපාර්තමේන්තුව	2
30	විභාග දෙපාර්තමේන්තුව	1
31	විදේශ සේවා නියුක්ති කාර්යාංශය	1
32	කාළගුණ දෙපාර්තමේන්තුව	1
33	ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව	1
34	බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	1
35	තේ පර්යේෂණ මණ්ඩලය	1
36	මැදිහත්විය නොහැකි පැමිණිලි	1031
	මුළු ගණන	1628

2.8 වසර 10 තුල පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය වෙත ලද පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය

2025 වර්ෂයද ඇතුලත්ව වසර 10ක් තුල ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීමේදී පෙනී යන්නේ, වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ 2019 වර්ෂය තුල බවයි. එය 1794කි. අනතුරුව වැඩිම පැමිණිලි සංඛ්‍යාව ලෙස 2025 වර්ෂයේදි පැමිණිලි 1628ක් ද, 2023 වර්ෂයේදී පැමිණිලි 978 ක් ද ලැබී ඇත. අඩුම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ 2013 වර්ෂයේදී ය.

ප්‍රස්තාරය: 5 - වසර 10ක් තුල ලද පැමිණිලි සංඛ්‍යාව



පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

03 පරිච්ඡේදය -2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	2024 රු.	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		36,573,000	30,945,000	ඒසීඒ-3
-	තැන්පතු		13,648	5,405	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		1,731,292	2,076,992	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**38,317,940**	**33,027,397**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**38,317,940**	**33,027,397**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**3,329,320**	**73,910**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**34,988,620**	**32,953,487**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
21,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	15,753,003	14,085,287	ඒසීඒ-2(ii)
21,880,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	17,294,261	17,025,237	ඒසීඒ-2(ii)
420,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	303,310	285,478	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
43,500,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**33,350,573**	**31,396,001**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	ඒසීඒ-2(ii)
2,380,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	601,760	179,750	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
120,000	හැකියා වර්ධනය	14	120,000	50,000	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
2,500,000	**මුළු මූලධන වියදම් (උ)**		**721,760**	**229,750**	
	තැන්පතු ගෙවීම්		13,648	5,405	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		1,973,299	1,830,604	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,986,947	1,836,009	
46,000,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		36,059,280	33,461,760	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(1,070,660)	(508,274)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(1,070,660)	(508,274)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			(1,070,660)	(508,274)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ , පිරියත හා උපකරණ	ඒසීඒ -6	12,764,516	12,200,456
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ -5/5(ඒ)	2,797,513	2,555,506
මුදල් හා මුදල් සමාන ද	ඒසීඒ -3	-	-
මුළු වත්කම		**15,562,029**	**14,755,962**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,797,513	2,555,506
දේපළ පිරියත හා උපකරණ සංචිතය		12,764,516	12,200,456
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ -5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ -4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ -3	-	-
මුළු වගකීම්		**15,562,029**	**14,755,962**

පිටු අංක 01 සිට 24 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 25 සිට 55 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති **රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට** අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා , ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි /ප්‍රධාන ගණකාධිකාරි අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2026.02.23	දිනය : 2026.02.23	දිනය : 2026.02.23

කේ.බී.කේ. හිරිඹුරේගම
පරිපාලන කටයුතු පිළිබඳ
පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)
අංක 14, පළමු මහල, ආර්.ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

කේ.බී.කේ. හිරිඹුරේගම
පරිපාලන කටයුතු පිළිබඳ
පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)
අංක 14, පළමු මහල, ආර්.ඒ. ද මෙල් මාවත.

එච්. පී. ඒ. පතිරණ
පරිපාලන නිලධාරිනී
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු
කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය
පළමු මහල, අංක 14,
ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 04.

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2025 | ඔම්බුඩ්ස්මන් කාර්යාලය 12

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ -සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය 2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	835,610	653,400
අග්‍රිම ලැබීම්	36,573,000	30,945,000
අත්තිකාරම් අයකර ගැනීම්	2,040,039	2,251,556
තැන්පතු ලැබීම්	13,648	5,405
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**39,462,297**	**33,855,361**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	33,047,263	31,110,524
සහනාධාර සහ මාරුකිරීම්	303,310	285,478
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම , මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	120,000	50,000
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	86,193	319,690
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	3,329,320	73,910
අත්තිකාරම් ගෙවීම්	1,960,803	1,830,604
තැන්පතු ගෙවීම්	13,648	5,405
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**38,860,537**	**33,675,611**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**601,760**	**179,750**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	601,760	179,750
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**601,760**	**179,750**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(601,760)**	**(179,750)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		-
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	නැත	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	43,500	34,450	33,350	77%
ප්‍රාග්ධන	2,500	2,500	722	29%

3.7 මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	නැත	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ		12,764,516		
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/A/OMB/02/25/03 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2026 මැයි 22 දින

02 JUN 2026

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

ශීර්ෂය 022 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 022 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

02 JUN 2026
02 JUN 2026

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ ,මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය විසින් වාර්ෂික හා කාලින මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

2

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

රජයේ මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයින්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

1.7 අත්තිකාරම් ගිණුම්

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ශේෂය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.2,797,513 ක් වුවද එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.2,760,756 ක් වූයෙන් රු.36,757 ක වෙනසක් විය. මෙය 2006 වර්ෂයේ සිට පැවත එන වැරදි හර කිරීමක් වූ අතර එම වෙනස නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි.

3

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව, සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර තිබෙන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විශේෂයෙන් වගබලා ගත යුවත්, පහත දැක්වෙන කරුණු හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කර නොතිබුණි.

(අ) වැය විෂයයන් 04 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදනය මු.රෙ 66 මඟින් මාරු කර ගැනීමෙන් සියයට 12 සිට සියයට 26 දක්වා පරාසයකින් වැඩිකරගෙන තිබූ අතර තවත් වැය විෂයයන් 02 ක සියයට 05 සිට සියයට 10 දක්වා පරාසයකින් අයවැය ප්‍රතිපාදනය අඩු කරගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 02 ක් සඳහා මු.රෙ 66 යටතේ මාරු කරගෙන තිබුණු එකතුව රු.210,000 කින් රු.127,824 ක් හෙවත් සියයට 30 ක් හා 74 ක් ලෙස ඉතිරි වී තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.550,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනය හා තවත් පුනරාවර්තන වැය විෂයයන් 08 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.14,700,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.6,926,846 හෙවත් සියයට 24 සිට සියයට 91 දක්වාද ඉතිරි වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ (ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම) සඳහා සලසා තිබුණු රු.1,200,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 598,240 ක් හෙවත් සියයට 50 ක්ද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම සඳහා වූ රු.1,200,000 ක ප්‍රතිපාදනයෙන් මු.රෙ. 66 යටතේ රු.20,000 ක් අඩු කල පසුවත් රු.1,180,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

4

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු කිරීම

2025 ජනවාරි 01 දින වන විට පරීක්ෂණ පැවැත්වීමට හා වාර්තා කිරීමට නියමිත ඉකුත් වර්ෂයේ අවසන් නොකළ පැමිණිලි 885 ක් ද, සමාලෝචිත වර්ෂය තුල ලද පැමිණිලි 1,628 ක් ද ලෙස වර්ෂය තුළ පරීක්ෂා කිරීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 2,513 ක් වූ අතර ඉන් වර්ෂය තුල පැමිණිලි 1,814 ක් සම්බන්ධයෙන් කටයුතු සිදුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැමිණිලි 699 ක් පරීක්ෂණ පැවැත්වීමට හා වාර්තා කිරීමට ඉතිරිව තිබුණි.

4.1.2 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරි සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

(අ) විගණනයට ඉදිරිපත් කළ සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත අනුව 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 ඡේදය අනුව මාර්ගෝපදේශ 05 ප්‍රකාරව ඡේද අංක 03,04,05,06 සහ 07 ඡේදයන් ඇතුළත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දක්වා ඇති පරිදි 2024 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ නොවිසඳි ඇති පැමිණිලි සංඛ්‍යාව 885 ක් වූ අතර එම පැමිණිලිවලට අදාලව කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදය අනුව 2025 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා අනුමත කර 2024 දෙසැම්බර් 10 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවද නියමිත දිනට විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර ඉදිරිපත් කල ප්‍රසම්පාදන සැලැස්ම මාර්ගෝපදේශ 13 හි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව සකස් කර නොතිබුණි.

(ආ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම ජූලි මාසය වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද රු.1,200,000 ක් වූ මුළු ප්‍රතිපාදිත මුදලම ඉතිරිව් තිබුණි.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NAOSL NATIONAL AUDIT OFFICE

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

රජයේ මුදල් රෙගුලාසි 880 හි විධිවිධාන යටතේ 612 අධිකාරීය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් මුදල් හා සම්බන්ධව රාජකාරි කරන නිලධාරීන් එම මුදල් රෙගුලාසි අනුගමනය කරමින් ඇප තැබීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි.

5. මානව සම්පත් කළමණාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2023 නොවැම්බර් 30 දිනැති අංක 02/2018(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල පුහුණු වෙනුවෙන් රු.120,000 ක් වියදම් කර තිබූ අතර 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 වන ඡේදය හා මාර්ගෝපදේශ අංක 14 හි ඇමුණුම 1 හි 6.3 ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය යටතේ ආයතනයේ සංවර්ධනය උදෙසා පුහුණු වැඩසටහනට දායක වූ ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 32 ක් වූ අතර එයින් තනතුරු 12 ක් පුරප්පාඩු වී පැවතුණි. පැමිණිලි සම්බන්ධ පරිපාලන නිලධාරී තනතුර වර්ෂ 07 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පවතින අතර එය කාර්යාලයේ අරමුණු ක්‍රියාත්මක කරලීම සඳහා බාධාවක් විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

6

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
පැමිණිලි ලියාපදිංචි කිරීම සහ පිළිගැනීමේ ලිපි යැවීම	√		
පිළිගත් පැමිණිලි විමර්ශනයට පියවර ගැනීම	√		
පිළිගත් පැමිණිලි විමර්ශන සම්පූර්ණ කිරීම	√		
සම්පූර්ණ කල විමර්ශන වලට වාර්තා සකස් කිරීම	√		
යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක වී ඇත්දැයි පරීක්ෂා කිරීම	√		
පැමිණිලි ලේඛනගත කිරීම සහ සංරක්ෂණය	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න. *

*ආයතනයේ කාර්ය භාරය අනුව තිරසාර සංවර්ධන අරමුණු ඍජුව හඳුනාගත නොහැක.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
-	-	-	-	-	-

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.*

රාජ්‍ය, පළාත් පාලන, ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා සහ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් විසින් ගනු ලබන දෝෂ සහගත පරිපාලනමය තීන්දු හේතුවෙන්, අසාධාරණයන්ට ලක් වී ඇති පුද්ගලයන්ට, එකී අයුක්තීන් නිවැරදි කරදීම හා එම ක්‍රියාවලිය තුලින් රාජ්‍ය පරිපාලනය කාර්යක්ෂමව හා ඵලදායිව ඉටුකර ගැනීමට රාජ්‍ය යාන්ත්‍රණයට සහය වීම මෙන්ම, විධායක තීරණ ගැනීමේදී, ඒවා නිවැරදි ආකාරයට හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කරලීම සඳහා කටයුතු කිරීම අපගේ ප්‍රධාන අරමුණ වන බැවින් විවිධ ආයතන සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලිවල විෂය පථය අනුව,ඒ ඒ ආයතන වලින් සපිරෙන තිරසාර සංවර්ධනය අරමුණු සපුරාලීමේ කාර්ය සඳහා අප ආයතනය වක්‍රව දායක වේ. (2.6 විශ්ලේෂණය පරිදි)

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	01	01	-
තෘතියික	04	02	02
ද්විතියික	17	13	04
ප්‍රාථමික	10	5	5

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අනුමත කාර්ය මණ්ඩල සියල්ල සම්පූර්ණ නොවීම හේතුවෙන් සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට දුෂ්කරතා මතුවීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
ලිපි ගොනු කළමණාකරණය	10	එක් දින	දේශීය		දේශිය	නිලධාරින් ආකල්ප සංවර්ධනය

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න පුහුණු වැඩහටහන් මගින් ලබාගන්නා දැනුම උපයෝගිකරගෙන ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවාගත හැකිවීම.

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	2023.11.30 දිනැති අංක 5/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය තුළ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම	අනුකූල වේ.	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අදාල නොවේ.	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත.	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.8	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.9	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.10	අවදානම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.11	සාමාජික ණය ලේඛනය (CC10) ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-

3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදු කර තිබීම	අනුකූල වේ.	-	-
3.2	මූල්‍ය බලතල පැවරීම ආයතනය තුළ සන්නිවේදනය කර තිබීම	අනුකූල වේ.	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.	-	-
3.4	2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිත කිරීමේදී එම මෘදුකාංගයට අදාළ පළමුවන මුර පදය ගණකාධිකාරී හෝ ඔහුගේ අවසරය ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කිරීම.	අනුකූල නොවේ.	කාර්යාලයේ ගණකාධිකාරිවරයෙකු නොමැත.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි පරිපාලන නිලධාරි මගින් එම කටයුතු සිදුවේ.
3.5	ඉහත 3.4හි සඳහන් මෘදුකාංගයට අදාළ පළමුවැනි, දෙවැනි හා තෙවැනි මුර පද තුන්මසකට වරක් වෙනස් කර තිබේද?	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ඇමුණුම 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරකම් (Annual Activity Plan) සැලැස්ම පිළියෙල කිරීම	අනුකූල වේ.		
4.2	ඉහත චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කිරීම	අනුකූල වේ.		
4.3	ඉහත චක්‍රලේඛයේ 5.2 ඡේදයේ සඳහන් පරිදි භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ 04 ප්‍රකාරව:			
4.3.1	අනුමත මූල්‍ය ප්‍රතිපාදන පදනම් කරගෙන වාර්ෂික අග්‍රිම සීමාව නියම කිරීම සඳහා අදාළ වාර්ෂික අක්මුදල් අයදුම් පත්‍රය නියමිත දිනයට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණේද?	අනුකූල වේ.		
4.3.2	මාසික අක්මුදල් අයදුම් පත්‍රය (TOD/IMP/4) හා අතැති බිල්පත් වාර්තාව (TOD/IMP/10) නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේද?	අනුකූල වේ.		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියලුම විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළතදී පිළිතුරු ඉදිරිපත් කර දී තිබීම	අනුකූල වේ.	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	සියලුම අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මාසයක් ඇතුළතදී පිළිතුරු ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත..	
6.2	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත.	
6.3	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත.	
6.4	මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන/සැලැස්ම වර්ෂය ආරම්භයේදී පිළියෙල කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත.	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා තිබීම	අනුකූල නොවේ.	කාර්යාලයේ විගණන හා කළමනාකරණ කමිටුවක් නොමැත.	අභ්‍යාන්තර විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	-	-

8.3	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.3 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	විශේෂිත වියදම් ඒකකය සතු සියලු වාහනවල අයිතිය තහවුරු කෙරෙන ලියවිලි තිබීම	අනුකූල වේ	-	-
9.2	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ.	සංචිත වාහන නොමැත.	-
9.3	වාහන සංචිතයේ ඇති සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර තිබීම	අනුකූල නොවේ.	සංචිත වාහන නොමැත.	-
9.4	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	ගර්හිත වාහන නොමැත.	-
9.5	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.6	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
9.7	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.8	2023.08.24 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 6/2023 හි 4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර තිබේද?			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.	-	-

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**විදේශ ප්‍රදාන**			
14.1	ආයතනයට ලැබී තිබුණු විදේශාධාර සම්බන්ධයෙන් 1994.04.20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම	අනුකූල නොවේ	විදේශ ප්‍රදාන නොලැබුනි.	
15	**අග්‍රිම ගිණුම**			
15.1	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය, භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නියමිත දිනයට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය/වාර්තා කිරිම	අනුකූල වේ		
15.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-

15.4	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ සාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය (TOD/IMP/05) නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
16	**ආදායම් ගිණුම**			
16.1	රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කිරීම	අනුකූල වේ	-	-
16.2	අදාළ විධිවිධානවලට අනුකූලව රැස්කළ ආදායම් ආපසු ගෙවීම	අනුකූල නොවේ	එවැනි ආදායම් ආපසු ගෙවීම් නොතිබුණි	-
17	**වාර්ෂික කාර්යසාධන වාර්තාව**			
17.1	2025.05.30 දිනැති අංක 2/2025 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර නියමිත විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.	අනුකූල වේ	-	-
18	**මානව සම්පත් කළමනාකරණය**			
18.1	අනුමත සීමාවන් ඉක්මවා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර/බඳවා නොගැනීම.	අනුකූල වේ		
18.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත ලිඛිත කාර්ය පැවරුම් කර තිබීම.	අනුකූල වේ		
18.3	2017.09.20 දිනැති අංක 04/2017 දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛය ප්‍රකාරව ආයතනයේ නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යෑම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මියයාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්ය මණ්ඩලය වෙනස්වීම් අනුව යාවත්කාලීන කරන ලද කාර්ය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී, මාසයක් ඇතුළත, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම	අනුකූල වේ		
18.4	ඵලදායී සේවක කාර්ය සාධන ඇගයීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ		

කොටස 02				
1	**මහජනයා / වෙනත් ඉල්ලුම්කාර පාර්ශවයන් වෙත තොරතුරු ලබා දීම**			
1.1	තොරතුරු දැන ගැනීමේ පනත ප්‍රකාරව මහජනයා/ වෙනත් ඉල්ලුම්කාර පාර්ශවයන් වෙත විශේෂිත වියදම් ඒකකයට අදාළ තොරතුරු ලබා දීම සඳහා තොරතුරු නිලධාරියෙක් පත්කිරීම	අනුකූල වේ	-	-
1.2	තොරතුරු දැන ගැනීමේ පනත ප්‍රකාරව මහජනයා/ වෙනත් ඉල්ලුම්කාර පාර්ශ්වයන් විසින් ඉල්ලනු ලබන තොරතුරු, ඒවා ලබා දීම හා ලබා නොදීමට හේතු ඇතුළත් ලේඛනයක් පවත්වා ගැනීම	අනුකූල වේ		
1.3	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත යැවිය යුතු වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර යැවීම	අනුකූල වේ		
1.4	මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීම, ලේඛනගත කිරීම, එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග දැක්වෙන ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගැනීම.	අනුකූල වේ		
1.5	ආයතනයේ තොරතුරු මහජනයා වෙත ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර යාවත්කාලීන කර තිබීම.	අනුකූල වේ		
1.6	ඉහත සඳහන් වෙබ් අඩවිය මගින් මහජනයාගේ අවශ්‍යතාවයන් ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල නොවේ	වෙබ් අඩවිය සංවර්ධනය සහ යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී.	
2	**තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම-1**			
2.1	විශේෂිත වියදම් ඒකකය විසින් සිය විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබුණේද? හඳුනා ගත් අරමුණු සඳහන් කරන්න.	අනුකූල නොවේ	තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමු	
3	**තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම- 2**	අනුකූල නොවේ	**ආයතනයේ කාර්යය භාරයේ ස්වභාවය අනුව තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට කටයුතු ඉදිරියේදී කටයුතු කරමු.**	

4	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
4.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.	-	-
4.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
5	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම -1**			
5.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ.	ඉදිරියේදී අවශ්‍යතාව පරිදි සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.	-
5.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ.	පොදු වශයෙන් පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කරවීය.	ඉදිරියේදී නියමිත පරිදි සිදු කිරීමට කටයුතු කරමු.
5.3	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පැවරීම.	අනුකූල නොවේ.	සකස්කර නොමැත.	ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරමි.
6	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම -2**			
7	**වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**			
7.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති විසින් ප්‍රකාශ කළ විගණන මතය	පැහැදිලි මතය	-	-
8	**වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2**			
8.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණේද?	අනුකූල වේ.	-	-
8.2	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විශේෂ වියදම් ඒකකය වෙත නිකුත් කරන ලද නියෝග හෝ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණේද?	-	එවැනි නියෝගයක් හෝ නිර්දේශයක් නිකුත් කර නොතිබුණේ	-

9	**කාර්යසාධන දර්ශකවලට ළඟාවීම**			
9.1	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දි ඇති ආකෘතියේ 4 පරිච්ඡේදයේ සඳහන් පරිදි විශේෂ වියදම් ඒකකය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්ය සාධන දර්ශක තුනක් ඇතුළත් කර තිබුණේද? 3	අනුකූල නොවේ.	මිනුම් කළ හැකි කාර්ය සාධන දර්ශක හඳුනාගැනීමට කටයුතු කරමින් පවතී.	-
10	**කාර්යසාධන දර්ශකවලට ළඟාවීම-2**			
10.1	කාර්ය සාධන වාර්තාවේ ඇතුළත් කර තිබුණු කාර්ය සාධන දර්ශක අනුව විශේෂ වියදම් ඒකකය විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්යභාරයෙන්, ප්‍රගතිය මැනීමේ කාර්ය සාධන දර්ශක අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට අත්පත් කර ගෙන තිබුණු ප්‍රගතිය මැනීම.	අනුකූල නොවේ.	මිනුම් කළ හැකි කාර්ය සාධන දර්ශක හඳුනාගැනීමට කටයුතු කරමින් පවතී.	
11	**සුපිළිපන්න රාජ්‍ය සේවයක් සඳහා**			
11.1	2023 අංක 9 දරන දූෂණ පනතේ විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂයට අදාළ වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුතු සියලුම රජයේ නිලධාරින් විසින් නියමිත දින හෝ ඊට පෙර තම වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ.156(1) ප්‍රකාරව යම් කිසි නිලධාරියෙකුගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරදක් හෝ වංචාවක් හේතු කොටගෙන රජයට සිදුවන ඕනෑම පාඩුවක් සම්බන්ධයෙන් එම නිලධාරියාගෙන් සිදුවන පාඩුව පූර්ණය කර ගැනීමට කටයුතු කිරීම	අනුකූල නොවේ.	එවැනි පාඩුවක් සිදු වී නොතිබුනි	
11.3	මු.රෙ.119 ප්‍රකාරව අධිභාරයක් ලෙස මුදලක් ගෙවන ලෙස නියම කර ඇති රජයේ සේවකයෙකුගෙන් එම මුදල, මුදල් රෙගුලාසි ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කිරීම	අනුකූල නොවේ.	එවැනි අධිභාරයක් පනවා නොතිබුනි	
11.4	විශේෂ වියදම් ඒකකයේ වර්ෂ 6ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් පිළිබඳ තොරතුරු මාරු මණ්ඩල වෙත ඉදිරිපත් කර ඉන් සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරුවීම් නොකරන ලෙස මාරු මණ්ඩලය වෙත ඉල්ලීම් නොකළ නිලධාරින් හැර අනෙක් සියළුම කාර්ය මණ්ඩල වාර්ෂික ස්ථාන මාරු කිරීමට කටයුතු කිරීම	අනුකූල වේ.		
12	**මූල්‍ය වංචා සිදුවීම වැළැක්වීම**			
12.1	අදාළ කාලපරිච්ඡේදය තුළ ආයතනය විසින් සිදු කළ විධිමත් පරීක්ෂණයකින් පසුව අනාවරණය වූ මූල්‍ය වංචා ගණන	**සිදු වී නැත**		

8. අවසන් නිගමන

පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන්නාවූත්, ඔවුන්ගේ දුක්ගැනවිලිවලට සහනයන් ලබා දෙන්නාවූත්, ඔවුන්ට හිමිවිය යුතු ගරුත්වය ලබා දෙන්නාවූත්, එමෙන්ම ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසය තහවුරු කරන්නාවූත්; ස්වාධීනවත්, අපක්ෂපාතීවත්, ලාභදායිවත්; ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයකට ප්‍රවේශ වීමට පුරවැසියන්ට අවස්ථාව ලබා දෙන්නා වූ වේදිකාවක්, ඔම්බුඩ්ස්මන්වරයා මගින් සලසා ඇත.

නිවැරදි පරිපාලනය,නූතන සමාජයේ මූලික අවශ්‍යතාවයක් වේ. මෙම කාර්ය අරමුණු කරගෙන රාජ්‍ය පරිපාලන කටයුතුවලදී සිදුකරන දෛනික කාර්යයන් ඉටු කිරීම සඳහා වගකිවයුතු රාජ්‍ය යාන්ත්‍රණයක් වෙත, පුළුල් ලෙස මහජන සුබ සිද්ධිය සැලසීමෙහිලා පරිපාලනමය යාන්ත්‍රනය වෙත, සුවිශාල බලයක් පැවරී ඇත. එලෙස බලතල ලබාදීම රීති, රෙගුලාසි, ස්වාභාවික යුක්තියේ මූලධර්ම සහ සමානාත්මතාවය උල්ලංඝනය කිරීම සඳහා එම බලතල අදාල කර ගත යුතු බවක් අදහස් නොවේ.

නොමනා ලෙස පරිපාලනමය කටයුතු සිදු කිරීම හේතුවෙන් කිසියම් පුද්ගලයෙකුට අසාධාරණයක් සිදු වී ඇත්නම්, එය හඳුනාගෙන පරීක්ෂාවට භාජනය කිරීමෙන් අනතුරුව එය නිවැරදි කරමින් සහන සලසාදීම සඳහා ඔම්බුඩ්ස්මන් කාර්යාලය සැමවිටම විවෘත කර ඇත. මෙම ආයතනය මගින් සලකා බලනු ලබන සහ නිවැරදි කරනු ලබන කරුණු අතර ප්‍රධාන කරුණු වනුයේ, දූෂිත හෝ පක්ෂග්‍රාහී අරමුණු සඳහා බලතල අත්තනෝමතික ලෙස ක්‍රියාවෙහි යෙදවීම හෝ නිල වගකීම් ඉටු කිරීමේදී සිය වගකීම් ප්‍රතික්ෂේප කිරීම හෝ නියමිත ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කිරීම යනාදීයයි.

අධිකරණයන් වෙතින් සහන අයැදීම නූතන කාලීනව, විශාල වියදම් දැරිය යුතු කටයුත්තක් බවට පත්වී ඇත. අධිකරණය වෙත හෝ විනිශ්චය සභාවක් වෙත යාම, ප්‍රමාණවත් තරම් මුදල් තිබීම මත රඳා පවතින බව නොරහසකි. ඒ අතරම, වසර ගණනාවක් තිස්සේ ලැබෙන පැමිණිලි සංඛ්‍යාව මත පදනම්ව, සංස්ථානික ගැටලු පෙන්වාදීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයා සතු බලතල සහ ඒ සඳහා ඇති පළපුරුද්ද නිසා පරිපාලනමය දෝෂ විසඳීම සඳහා අධිකරණයකට වඩා බොහෝ විට ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු වීම වඩා ඵලදායි වනවා ඇත. එය වඩාත් නම්‍යශීලී සහ අඩු පිරිවැයකින් යුක්ත ක්‍රමයකි. ඊට අමතරව, ඔම්බුඩ්ස්මන් කාර්යාලය විශේෂයෙන්ම වැඩි අවදානම් සහිත කණ්ඩායම් වලට, අඩු වියදමකින් එසේ නොමැතිනම් වියදමකින් තොරවම, ආරම්භක ප්‍රවේශයක් ලබා දෙන අතර මෙම ක්‍රමවේදය සාම්ප්‍රදායික අධිකරණ පද්ධතියකට වඩා වාසි සහගත වනවා ඇත. එසේම, විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ, නීතීඥවරුන්ට හෝ නියෝජිතයෙකුට මෙම ආයතනයේ පරීක්ෂණවලදී පැමිණිලිකරුවන් වෙනුවෙන් පෙනී සිටිය නොහැකි වීමයි.

තවද, මෙහිදී සඳහන් කළ යුත්තේ, චෝදනා පිළිබඳ විමර්ශන සිදු කිරීමේදී එම පැමිණිලිලට අදාළ කරුණු පිළිබඳව ගැඹුරින් අධ්‍යනය කර දෙපාර්ශවයටම කරුණු ඉදිරිපත් කිරීමට මෙම ආයතනය අවශ්‍ය කරම් ඉඩකඩ සලසා දෙන බවයි.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත සම්මත කිරීම තුලින් අපේක්ෂිත ඉලක්කයන් සාක්ෂාත් කරගැනීමෙහිලා ගනු ලබන ක්‍රියාමාර්ගයේදී වගකිව යුතු නිලධාරීන් විසින් දක්වන ආකල්පය පිළිබද අදහස් දැක්වීම ද අවශ්‍ය කරුණක් වේ. මෙම කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු පරීක්ෂා කිරීමේදී, සමහර රාජ්‍ය නිලධාරීන් සිය රුචිකත්වයන් අනුව පිළිපැදිය යුතු නීති, රෙගුලාසි සහ රීතින් නොසලකමින් හෝ ස්වකීය අභිමතය පරිදි ඒවාට අර්ථනිරූපණයන් ලබා දෙමින් තීරණ ගැනීමේ අවස්ථාවන්, සහ පක්ෂපාතී තීරණ ගැනීමේ අවස්ථාවන් මවිසින් නිරීක්ෂණය කොට ඇත. මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම් කඩවන අන්දමේ වැරදි ක්‍රියාවන් සිදු කිරීම මගින් යම් තැනැත්තන් හට නීත්‍යානුකූලව ලැබිය යුතු අයිතිවාසිකම් අහිමි වීමත්, ඊට අමතරව ඇතිවන සිත් වේදනාවත්, රාජකාරි ඉටු කිරීමේදී නිලධාරීන් විසින් අමතක කර දමන බවක් පෙනී යයි. බොහෝ ආයතන විසින් කරුණු විමසීමේදී ඒ සඳහා පිළිතුරු සැපයීම ඉතා ප්‍රමාද වන අතර සිහිකැඳවීම් වලට පවා ප්‍රතිචාර නොදැක්වීමද නිරීක්ෂණය කරන ලදී.

සමහර නිලධාරීන්ගේ අලස භාවයන් සහ කාර්යක්ෂම ලෙස ගැටලු විසඳීමට අකමැති හෝ එසේ නොමැති නම් ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ නොහැකියාව ද, මවිසින් නිරීක්ෂණය කරන ලද තවත් විශේෂ කරුණකි. විශේෂයෙන්ම, පාර්ශවකරුවන් අතර ඇති වන ආරවුල් වැනි ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඇතැම් නිලධාරීන් ප්‍රමාණවත් තරමේ සමත්කමක් නොදක්වන බව හෝ ගැටලු විසඳීම සම්බන්ධයෙන් ඇති ඔවුන්ගේ නොහැකියාව ද පෙනෙන්නට ඇත. ගැටලු සුහදව නොවිසඳීමේ ක්‍රියාව ඔවුන් තුළින් පිළිඹිබු වන්නේ, පැමිණිලිකරුවෙකු හට විරුද්ධවාදියෙකු ලෙස සැලකීමේ ආකල්පය සහ රාජකාරීමය වශයෙන් සිදු වූ වැරැද්ද පිළිගැනීමට ඔවුන් තුළ ඇති අකමැත්ත යනාදී හේතූන් නිසාය.

ගැටළු නිරාකරණ ක්‍රියාවලියේදි, නොයෙකුත් ප්‍රශ්ණ සහ දුෂ්කරතා එක්තරා ප්‍රමාණයකට මතු වුවත්, මාගේ රාජකාරි කටයුතු වඩාත් ඵලදායි ලෙස ඉටු කර ගැනීමට හැකිවන අයුරින්, සමස්ථයක් වශයෙන් ගත්කල සියළුම නිලධාරීන් විසින් දක්වන සහයෝගය සැලකිය යුතු මට්ටමක පවතින බව ද මේ අවස්ථාවේදී සඳහන් කළ යුතු වැදගත් කරුණකි.

අවසන් වශයෙන් සඳහන් කලයුතු වන්නේ, මෙම කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින්, ඔවුන් මුහුණපාන දුෂ්කරතා මධ්‍යයේ වුවද, ලැබෙන පැමිණිලි සැලකිය යුතු සංඛ්‍යාවක කටයුතු අවසන් කිරීමට සමත් වී ඇති බවයි. කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව සම්පූර්ණ ලෙස පුරවා නැති අතර, ගණකාධිකාරිවරයෙකු හෝ පොත් තබන්නෙකු හෝ මෙම කාර්යාලයට පත් කර එවා නොමැත. ඔම්බුඩ්ස්මන් කාර්යාලය හා සමාන කාර්යයන් ඉටු කරන ආයතනවල කාර්ය මණ්ඩල සඳහා ගෙවනු ලබන දීමනාවන්, මෙම කාර්ය මණ්ඩලය සඳහා නොගෙවීම නිසා මෙම කාර්යාලයේ සේවය කිරීමට නිලධාරීන් අකමැත්තක් දක්වන බව ද නිරීක්ෂණය වන කරුණකි.

මෙම වාර්තාව අවසන් කිරීමට පෙර, අප කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන දුෂ්කර කර්තව්‍ය අගය නොකරන්නේ නම් එය මවිසින් සිදු කරනු ලබන අතපසුවීමක් බව, අවසාන වශයෙන් සඳහන් කළ යුතුමය. අප විසින් ලඟා කර ගත යුතු ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා සියලු බාධකයන් පසෙකලා රාජකාරි කටයුතු ඉටු කරන මාගේ කාර්ය මණ්ඩලය වෙත, මාගේ කෘතඥතා පූර්වක ස්තූතිය පිරිනමමි.

විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු කේ.බී.කේ.හිරිඹුරේගම
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්
(ඔම්බුඩ්ස්මන්)

2879

සෞ අංක (42)

ටෙංමා/ප/ස/9/1631

ජයන්ති චිත්‍රා කුමාරි,

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි,

අංක 4 A,

ගංගා මාවත,

පොල්ගොල්ල,

2025/12/31

ඔම්බුඩ්ස්මන් තුමා,
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්,
(ඔම්බුඩ්ස්මන්) කාර්යාලය,
කොළඹ 04.,

සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබෙන රාජකාරී ලිපි ප්‍රමාද

වීම දැනුම් දීම සඳහා.

ඉහත නම් සඳහන් මා ඔබතුමා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කල අතර ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු විය.ඒ සම්බන්ධයෙන් විශේෂ ස්තූතිය ප්‍රකාශ කරමි.මා I වන ශ්‍රේණියට උසස් කළ ලිපිය පැමිණි බව 2025/12/30 දින මහනුවර ජාතික රෝහලෙන් දැනුම් දෙන ලදී.එම නිසා මාගේ ගැටළුව විසඳී ඇත.මාගේ පැමිණිලි අංකය ඉවත් කරගන්නා මෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිමි.

ස්තූතියි,

මෙයට සේවා ලැදි,

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි,

ජයන්ති චිත්‍රා කුමාරි
....

179

G.A.C.G. පෙරේරා,
විශ්‍රාමලත් මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී
16/3, උද්‍යාන පෙදෙස,
මහරනුගේගොඩ,
කඩවත.

2025-12-23

ගරු ඔම්බුඩ්ස්මන්තුමා,
ඔම්බුඩ්ස්මන් කාර්යාලය,
කොළඹ 04.

ගරු මැතිතුමනි,

බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්, මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පීන් හට හිමිවිය යුතු විශේෂ ශ්‍රේණියේ තනතුරු (MT 08) 03 ලබා නොදීම.

ඔබතුමන්ගේ OMB/P/2/03863 හා 2025/11/25 දිනැති ලිපිය ලදිමි.

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබතුමන් විශ්‍රාමික අප නිලධාරීන් හට වූ අසාධාරණය දැක, එය හැකිනම් නිවැරදි කරන ලෙස කළ ඉල්ලීමට ප්‍රසාදය පලකරමි.

ශ්‍රී ලංකාවේ පරිපාලන නිලධාරීන් තමන් දරන මතයක් කිසිදා වෙනස් නොකරන බව මෙම කරුණ සම්බන්ධයෙන් පළාත් සෞඛ්‍ය බලධාරීන් හා ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යැවූ වාර්තාවෙන් පැහැදිලි වේ. තනතුරු 03 ක පුරප්පාඩුව 2013 සිට පැවතියද එය ලබාදීමට අවශ්‍ය පියවර නොගෙන ඒවා ලබා නොදීමට තර්ක ඉදිරිපත් කර ඇත. ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ 25 දෙනෙක් පමණ විශ්‍රාම ලැබුවේ මෙම උසස්වීම අහිමි කිරීමේ අසාධාරණය සමග බව ඔවුන්ට නොවැටහීම අභාග්‍යයකි.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් පවා අනුමත වූ සේවක සංඛ්‍යා ලේඛනවල මෙම තනතුරු 03 දැක්වුවද එය ලබා නොදී, හිමිකරුවන්ට එය ලබා නොදීමට පරිපාලන නීති ගෙනහැර දක්වයි. මෙය මානව හිමිකම් කඩ කළ ක්‍රියාවක් වුවද ඒ සඳහා අධිකරණය වෙත යාමට අපට කාලයක් හෝ ධනයක් නොමැත.

ඔබතුමන්ගේ වටිනා කාලය අප වෙනුවෙන් යෙදවීම ගැන ගෞරවපූරක ස්තුතිය පලකරමි. අසාධාරණය නිවැරදි කිරීම වෙනුවට එය නීතියට අනුව නිවැරදි බව කරුණු දක්වන නිලධාරීන්ට ස්වභාව ධර්මය දඬුවම් කරනු ඇත.

ස්තුතියි,
මීට ඔබේ විශ්වාසී වූ,

....
G.A.C.G. පෙරේරා,
විශ්‍රාමලත් ම.සෞ.ර ශිල්පී

පිටපත : ගරු ලේකම් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ට හෝ මෙම (MT 08) ශ්‍රේණියේ තනතුරු ලබාදීමට බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අවධානය යොමු කරවීමට හා දැනගැනීම පිණිස.

ඔබේ අංකය :OMB/P/2/6/3724/2023

(178)

එස්.එම්. බණ්ඩාර (මිය)
අංක.265, කිරුළ පාර,
කොළඹ 05.

ඩබ්ලිව්.ජේ.ආර්. නිලුපුලක්ෂි,
අංක.193/බී, වෙදගම,
පස්යාල.

2025.12.23

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්,
ඔම්බුඩ්ස්මන් කාර්යාලය,
පළමු මහල, අංක.14,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

ගරු පාර්ලිමේන්තු කොමසාරිස්තුමණි,

ස්තුතිය ප්‍රකාශ කිරීම

පුද්ගලික සහකාර තනතුරට අදාල උසස් වීම ලබා නොදීම සම්බන්ධව

උක්ත කරුණ සම්බන්ධව ඔබේ අංක OMB/P2/6/3724/2023 දරන ලිපිගොනුව හා බැදේ.

අප සේවය කරන ආයතනයෙන් අපට සිදු වූ අසාධාරණය විසදීම සදහා 2023.08.23 වන දින ඔබතුමාගේ කාර්යාලයට පැමිණිල්ලක් ඉදිරිපත් කළ දින සිට 2025.11.21 වන දින අවසන් ලිපිය අප වෙත ලැබීම දක්වා කාලය තුල එම ගැටලුව විසදීමට මැදිහත් වී කටයුතු කළ ඔබතුමා ඇතුලු පරිපාලන නිලධාරිතුමිය, විෂයභාර නිලධාරිතුමිය ඇතුලු මෙ සම්බන්ධව කටයුතු කළ ආයතනයේ නිලධාරින් වෙත අපගේ ස්තුතිය පල කිරීමට මෙම ලිපිය යොමු කරන්නෙමු.

අපගේ පැමිණිල්ලට අදාල ලිපිගොනුව සම්බන්ධව මුල සිට රාජකාරි කටයුතු කළ විෂයභාර නිලධාරිතුමියට (මේධා මහත්මිය) අප විශේෂයෙන්ම ස්තුතිවන්ත වන්නෙමු. දුරකථන මාර්ගයෙන් ඇය හා සම්බන්ධ වීමේදී ඉතා කාරුණිකව හා සුහදශීලිව අප හා කටයුතු කර ඇත. එසේම අපගේ ගැටලුවලට සාවදානව අවධානය යොමු කර කටයුතු කළ බවද වැඩිදුරටත් දන්වමු. ඒ අනුව ඔබතුමාගේ කාර්යය මණ්ඩලය රාජ්‍ය සේවයේ නියුතු ඉතාමත් යහපත් හා ගුණගරුක නිලධාරින් බව අප ඉතා සතුටින් පවසා සිටින්නෙමු.

අපගේ පෙත්සම අනුව කටයුතු කර අපට උසස්වීම ලබා දෙන මෙන් ඔබතුමා විසින් නියෝගයක් ලබා දුන් අතර, අපගේ ආයතනය එය ක්‍රියාත්මක කළේ නැත. එම නියෝගය පිළිනොගන්නා බව අපට පවසයි. ජනාධිපතිතුමා වෙත යොමු කළ වාර්තාවද ජනාධිපති කාර්යාලයේ ආණ්ඩු ක්‍රම හා ව්‍යවස්ථාපිත අංශයේ මාස 03 ක කාලයක් රදවා ගෙන ඇත. එම වාර්තාව ජනාධිපතිතුමා වෙත යොමු කරන මෙන් අවස්ථා ගණනාවකදී එම කාර්යාලයේ නිලධාරින් හා සම්බන්ධ වී අප ඉල්ලීම් කර ඇත. එහෙත් අද දින දක්වාම එය සිදුවී නැත කෙසේ වුවත් අප තවදුරටත් ඒ පිළිබද සොයා බලමින් සිටින්නෙමු.

ගරු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස්තුමණි, ඉදිරියේදී පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ පනත සංශෝධනය කර හෝ ලබා දෙන නියෝග ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කිරීම හා නියෝග ක්‍රියාත්මක නොකර සිටීමකදී එම නිලධාරීන් අනිවාර්යයෙන් යටත්වන වරදක් හඳුන්වා දීම සිදු කළ හැකි නම් මෙම නියෝගයන්ට ගරු නොකර අත්තනෝමතිකව කටයුතු කරන ඇතැම් රජයේ නිලධාරීන්ට මෙම ආයතනයේ ඇති වටිනාකම හා ආයතනය පිහිටුවීමේ අරමුණ අවබෝධ කර ගනු ඇති බවට අප ඔබතුමාට ගෞරවයෙන් ප්‍රකාශ කර සිටින්නෙමු.

අපගේ පැමිණිල්ල පිළිබඳ කටයුතු කිරීමට මැදිහත් වූ ඔබතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට නැවත වරක් ඉතාමත් ස්තුතිවන්ත වන අතර ආයතනයේ ඉදිරි කටයුතු සියල්ල සාර්ථක වේවායි ද ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

ස්තුතියි.

මෙයට - විශ්වාසී,

එස්.එම්.බණ්ඩාර **ඩබ්.ජේ.ආර්. තිලුපුලක්ෂි**

7759

එම්. එම්. පියදාස
අඹගහපතන
කැද්දේවෙල
ගෙවිලවෙල
දෙමෝදර

2025.12.09

(177)

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු
කොමසාරිස්තුමා (ඔම්බුඩ්ස්මන්)
පරිපාල කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු
කොමසාරිස් කාර්යාලය
කොළඹ

12/17

ගරු: මැතිතුමනි,

ඔබගේ අංක OMB/P/2/2/4088/2023 හා 2025.11.24

දිනැති ලිපිය හා සැරදේ.

ඉඩමෙන් පර්. 03ක් අහිමිවීම සම්බන්ධව මා විසින් ඔබතුමා වෙත යොමු කල පෙත්සම සම්බන්ධවයි.

ඒ අනුව අදාල ප්‍රාදේශීය ලේකම්තුමාගේ අංක 2024/90 ට අදාලව සර්වේයර් ජනරාල්ගේ B/ELL/2024/657 යටතේ මැනුම් කටයුතු සිදුකර ඇති නඩු/පු. 20673 දරන පියනුම් පිඹුරු සැලැස්ම අනුව මට හිමි විය යුතු පර්. 36 කොටස හා අහිමි වූ පර්. 03 මාගෙව හිමි වූ තැනක් අම අදාල දිනවල පිරිසුද්කළ මා සමග තොරදී ඇති තැනක් අදාල විසඳී ඇති තැනක් පමණ අදාල සමතයට පත්කල ඔබතුමාට අවශ්‍ය කාරයක් ප්‍රකාශයක් කරන තැනක් මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

මෙයට
යටහත්

(signature)

P/21/16/3872

175

ඩී. ජී. එස්. මැණිකේ,
මස්මුකුල අලුත් ගාර්,
මල්මත්ත,
හොඹකවෙල,

2025.09.18

ඔම්බුඩ්ස්මන් මැතිතුමා,
පළමු මහල
අංක 14
ආර්. ඒ. ද මෙල් මාවත
කොළඹ 04

ස්තූතිය පළ කිරීම.

ඉහත නම හා ලිපිනය සඳහන් මා අනුහාර අංක NITF/24/14388 හා 2024.10.07 දිනැති ලිපිය මගින් මා හට අනුහාර හිමිකම ලබා නොදීම පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් කළෙමි.

එම ගැටළුව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී ඒ සඳහා අවශ්‍ය කටයුතු කර මා හට එම හිමිකම් ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කිරීම ඉහත අපාය කරමි. මා හට නොලැබීමට ගිය ප්‍රතිලාභයක් ලබා දීමට කටයුතු කිරීම ගැන ඔබතුමාට විශේෂ ස්තූතිය පුද කරමි.

මෙයට
විශ්වාසී.

ඩී. ජී. එස්. මැණිකේ

(ඩී. ජී. එස්. මැණිකේ)

Thank

OMB/P/2/2/4310/2025
2025/12/02

(176)

අමරා ශිල්පගේ රූබන් සුදර්මා මානෙල් මහත්මිය
වෛද්‍ය එම්. එම්. තව්ෆීක් (ඇටෝර්නි බලකරු) බාරේ
අංක 162, නානායක්කාර මාවත,
ඔබේසේකරපුර, රාජගිරිය.
ජංගම: 0760116161 | විද්‍යුත් තැපැල: mmthowfeek@gmail.com
දිනය: 2025 නොවැම්බර් 26

පාර්ලිමේන්තු පරිපාලන කොමසාරිස්
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
කොළඹ, ශ්‍රී ලංකාව

<u>මගේ ඉඩම් හිමිකාරිත්වය පිළිබඳ කාරණය විසඳීමට ඔබ දැක්වූ සහයෝගයට කෘතඥතාව පළ කිරීම</u>

හිතවත් පාර්ලිමේන්තු පරිපාලන කොමසාරිස්තුමනි,

මගේ දිගුකාලීන ඉඩම් හිමිකාරිත්ව ගැටලුව සම්බන්ධයෙන් ඔබ දැක්වූ අවධානය සහ සම්බන්ධීකරණය වෙනුවෙන් මම ගෞරවනීය ලෙස මාගේ අවංක ස්තූතිය පළ කරමි.

2013 සිට මෙම කාරණය ප්‍රමාද වීමට පැහැදිලි හේතුවක් නොලැබීමෙන් පසුව, ඔබගේ මැදිහත්වීමෙන් පසුව අවසානයේ මගේ හිමිකාරිත්ව ලේඛනය මට ලැබුණි. මෙය මහත් සහනයක් ලබා දී ඇති අතර ප්‍රතිසංස්කරණය කිරීම සහ ගොඩනැගිලි අනුමැතිය ලබා ගැනීම වැනි අත්‍යවශ්‍ය කටයුතු සමඟ ඉදිරියට යාමට මට හැකියාව ලබා දී ඇත.

කිසිදු ශ්‍රී ලාංකික පුරවැසියෙකුට නීත්‍යානුකූල අනුමැතියක් හෝ ලියකියවිලි හෝ වෙනත් කිසිවක් ලබා ගැනීමේදී අනවශ්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු නොවන පරිදි, එවැනි දීර්ඝ ප්‍රමාදයන් නැවත ඇතිවීම වැළැක්වීමට පියවර ගන්නා ලෙස මම කාරුණිකව ඉල්ලා සිටිමි.

ඔබගේ සහයෝගයට සහ අනුග්‍රහයට බොහොම ස්තූතියි.

ඔබගේ විශ්වාසී,
වෛද්‍ය එම්. එම්. තව්ෆීක්
අමරා ශිල්පගේ රූබන් සුදර්මා මානෙල් මහත්මිය වෙනුවෙන්
ඇටෝර්නි බලකරු

5241

ශ්‍රී. සාන්ති ද සිල්වා,
2/1A සංඝාරාමපාර,
වැවල,
පිළියන්දල,
2025.11.13.

174

පරිපාලන කටයුතු පිළිබඳ
පාර්ලිමේන්තු කොමසාරිස්
(ඔම්බුඩ්ස්මන්) කාර්යාලය,
පළමු මහල,
අංක: 14,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

OMB/P/2/9/1498/2024 ලිපිගොනු අංක දරන පැමිණිල්ල පිළිබඳව

ශ්‍රී. සාන්ති ද සිල්වා වන මා 2024.05.07 ඔබ ආයතනයට කළ පැමිණිල්ල අනුව ඔබ ආයතනය මගින් අප කැඳවා කළ නිර්දේශය අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මාගේ පැමිණිල්ල නැවත විභාග කොට ඒජන්සියට මාගේ හිඟ වැටුප මා හට ගෙවන ලෙස නියෝග කළ අතර මා හට මාගේ හිඟ වැටුප 2025.10.11 දින ගෙවා නිම කරන ලදී. ඒ අනුව මා හට යුක්තිය ඉටුවී ඇත. මාගේ පැමිණිල්ල පිළිබඳව සොයා බලා මා හට යුක්තිය ඉටු කර දුන් ඔබතුමන්ට හා ආයතනයේ සියලු ම දෙනාට මෙයින් ස්තූති වන අතර මාගේ පැමිණිල්ල අවසන් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට,
අගිසියට පත්ව සිටිමි,

[signature]

2396 C/08ed. 173

එස්.ඩී.චන්ද්‍රපත්මා,
147,
පරණ තංගල්ල පාර,
හම්බන්තොට.
2025.09.22
දූ.අ - 0711515173

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමා,
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය,
පළමු මහල
අංක 14
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 04

<u>බදු ඔප්පුව ලබා ගැනීම සඳහා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වැඩිපුර ගෙවන ලද මුදල ඔබතුමාගේ දැනුම්දීම මත මා හට ලැබීම සම්බන්ධව ස්තුතිය පල කරමි.</u>

ඉහත ලිපිනයෙහි පිහිටා ඇති මාගේ ඉඩම සඳහා බදු ඔප්පුවක් ලබාගැනීම සඳහා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.375360.00 මුදලක් ගෙවන ලදි.ඉන්පසු චක්‍රලේඛන උපදෙස් අනුව රු.220960 ක් මා විසින් වැඩිපුර ගෙවා තිබේ.

එය ලබා ගැනීමට මා මුලදී සැහෙන උත්සහ ගන්නා ලද නමුත් එය ලබා ගැනීමට නොහැකි විය.පසුව මා විසින් ගරු ඔබතුමා වෙත මාගේ දුක්ගැනවිල්ල ගැන ඉල්ලීමක් කරන ලදි.එහිදී ඔබේ අංක OMB/P/2/2/4181/12024 යටතේ ලිපි ගනුදෙනු කරන ලදි.

පසුව ගරු ඔබතුමා විසින් එම වැඩිපුර මා විසින් ගෙවන ලද මුදල මා වෙත ගෙවන ලෙස අදාල අංශ වෙත උපදෙස් ලබා දෙන ලදි.ඒ අනුව මා විසින් වැඩිපුර ගෙවන ලද රු.220960.00 මුදල මා වෙත ලැබුණි.

ඒ සම්බන්ධව ගරු පරිපාලන කටයුතු පාර්ලිමේන්තු කොමසාරිස්තුමනි ඔබතුමාට මාගේ ගෞරවනීය ස්තුතිය පලකරමි.

ස්තුතිය,
මෙයට,

....
එස්.ඩී.චන්ද්‍රපත්මා
ජා.හැ.අ - 636801054V

4931

171 172

ලි.ප.තැ

ඩබ්. ඩී. ශාන්තිලාල් අබේගුණවර්ධන
"ඇමොල්වාස"
ඉන්ලන්ඩ් හිල්ස් එස්ටේට්
කරාපිටිය,
ගාල්ල.
2025.09.20

පරිපාලන කටයුතු පිළිබඳ කොමසාරිස්,
ජනරාල්තුමා,
ඔම්බුඩ්ස්මන් කාර්යාලය,
14 වැනි මහල,
ආර්.ඒ. ඩී. මෙල් මාවත,
කොළඹ -04

ගරු පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමා වෙත,

මහත්මයාණෙනි,

මගේ අංකය OMB/P/2/2/3833/2022

අංක 810028 දරණ කඩැස්තර සිතියමේ 58 දරණ මාර්ගය පිළිබඳ ඇතිවූ ප්‍රශ්නය සම්බන්ධවයි.

අංක 810028 දරණ කඩැස්තර සිතියමේ 58 දරණ මාර්ගයේ ගැටලුව නිවැරදි කර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදන පත්‍රය ගාල්ලේ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කිරීමෙන් පසු 2025 වර්ෂයේ ජුනි මස නියෝජ්‍ය කොමසාරිස්තුමිය ගාල්ල කාර්යාලයෙන් ලබා ගත් අතර එම ගැසට් පත්‍රයේ පිටපත්ද මා වෙත ලබාදීමට කාරුණික විය. ඉහත කරුණ නිරාකරණය කර ගැනීමට ඔබතුමා ගත් උත්සාහයට ගෞරව පූර්වකව ස්තුතිය පල කරමි.

මෙයට විශ්වාසී,

ඩබ්. ඩී. ශාන්තිලාල් අබේගුණවර්ධන
විමසීම: 0718-012829 / 0765805045

පිටපත	නියෝජ්‍ය කොමසාරිස් තුමිය. ගාල්ල.

1st Place Winner
National Productivity
Award 2020

SLAB
ISO/IEC 17021
QMS-001-01

ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My Ref. CSS/9/7/2/23 | ඔබේ අංකය / உமது இல / Your Ref. | දිනය / திகதி / Date 2025.09. 04

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්,
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්
(ඔම්බුඩ්ස්මන්) කාර්යාලය,
කොළඹ 04.

බදු ඔප්පුවක් ලබාගැනීම සම්බන්ධයෙනි
එස්.ඩී. චන්ද්‍රපත්මා මිය - පැමිණිලිකාරිය

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක OMB/P/2/4181/2024 හා 2025.08.05 දිනැති ලිපිය හා බැඳේ.

02. මෙම සම්බන්ධයෙන් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් විසින් මා වෙත යොමු කරන ලද අංක SPLC/HAM/01/46/03/118 හා 2025.05.19 දිනැති ලිපිය මගින් ආදායමෙන් ආපසු ගෙවීම් පොදු 29 ආකෘති පත්‍ර හා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් සකස් කරන ලද සාධාරණිකරන වාර්තාව දකුණු පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සමගින් ඉදිරිපත් කර ඇත.

03. ඒ අනුව මා වෙත ලද ආදායමෙන් ආපසු ගෙවීම් පොදු 29 ආකෘති පත්‍ර අනුමත කර මාගේ අංක CSS/9/7/2/25 හා 2025.05.22 දිනැති ලිපිය මගින් දකුණු පළාත් ඉඩම් කොමසාරිස්ට පිටපතක් ද සහිතව හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇති බව කාරුණිකව දන්වමි.

04. තවද, ආදායමෙන් ආපසු ගෙවීම සඳහා ඉදිරිපත් කෙරුන පොදු 29 ආකෘති පත්‍රයෙහි නම සඳහන් සපුන්ත්‍රිගේ දොන් චන්ද්‍රපත්මා මහත්මියට ගෙවිය යුතු රු. 220,960.0 ක මුදල අංක 786110 හා 2025.06.17 දිනැති චෙක්පත මගින් ගෙවීම් සිදුකර ඇති බව හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්ගේ අංක HDS/LND/03/F/04/1197 හා 2025.09.03 දිනැති ලිපිය මගින් දැනුවත් කර ඇති බව ද කාරුණිකව දන්වා සිටිමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01. පළාත් ඉඩම් කොමසාරිස් ද. ප - කා. දැ .ගැ .ස
02. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හම්බන්තොට - කා. දැ .ගැ .ස

දුරකථනය : 091 494 4005 ෆැක්ස් : 091 223 4665 ඊ-මේල් : sp.treasury@gmail.com

ඒ. එම්. ඩොන් ජූලියට් මිය
කාරංගල්ලේගම
සේනපුර
2025.09.02.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් තුමා,
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය,
පළමු මහල, අංක 14
ආර්. ඒ. ද මෙල් මාවත
කොළඹ 04.

ගරු කොමසාරිස් තුමනි,

ඔබගේ ඇති පෙත්සමක් ඉවත් කර ගත් බව
දැනුම් දීම සඳහා

(ඔබගේ අංක OMB/P/2/2/4336 හා 2025.07.14 දින ලිපිය හා බැඳේ.)
වලනු අංක 171/362 දරන ඔබවෙත පෙත්සමක් කර තිබුම සඳහා ප්‍රසන්න ග්‍රාමය කාලියපුර පදිංචි H.M.D නයනජිය හා විදුලි අතර දාව කය ප්‍රහාරය කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවසර නොදීම ගාටලුව ඔබ ආයතනයට පැමිණිලි කළ වූ ප්‍රාදේශීය ලේකම්තුමා H.M.D නයනජිය යන අයට අවසර ලබා දුන් නව ඉඩම ගරු A.M.D ජූලියට් වන මා හට වාචිකව දැනුවත් කළ බව ඔබතුමාට දන්වන අතර නැවත පුරවත් H.M.D නයනජිය ඉඩමේ පෙත්සම ගත් ඉවත් කර ගත් ව්‍යාපාරය ඉදිරි කටයුතු සඳහා යොමු කරමි. මෙම සම්බන්ධයෙන් කැඩවීමෙන් කටයුතු කළ ගරු ලේකම්තුමා හට මෙන්ම අනෙකුත් නිලධාරීන්ට මාගේ ස්තූතිය පුද කර සිටිමි (දාව විදුලි කප්පාන්තිය පිටපතක් ද මේ සමග අමුණා ඇත.)

මෙයට
ඔබ ගේ
ඒ.එම්.ඩී. ජූලියට්

169

ඔබේ අංක : OMB/P/2/3945/2025

ජී.ආර්. ඉන්දික තුෂාර
අංක 83, ගජබා පෙදෙස,
කිරුළපන,
කොළඹ 06.
දු. අංක : 071 6010 342
2025/09/08

විශ්‍රාමලත් මහාධිකරණ ගරු විනිසුරු,
කේ.බී.කේ. හිරිඹුරේගම මැතිතුමා,
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය,
අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත,
කොළඹ - 04.

ගරු ඔම්බුඩ්ස්මන් තුමනි,

අස්වැසුම ලබා නොදීම සම්බන්ධවයි.

ඉහත මාගේ 2025/06/26 දිනැති පෙත්සමට අනුව 2025/08/06 දිනැති තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් තුමාගේ වාර්තාවේ පිටපත සහ ඔබතුමාගේ 2025/08/18 දිනැති ලිපිය මට ලැබුණු බව ගෞරවයෙන් දන්වා සිටිමි.

ඉන්පසුව 2025/08/27 දිනැති තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබා දී ඇති ලිපියට අනුව මාගේ සහෝදරයා නමින් ගාස්තු රහිතව බැංකු ගිණුමක් විවෘත කර ඇති බවද ගෞරවයෙන් දන්වා සිටිමි. (එම ලිපියේ පිටපත් මෙයට අමුණා ඇත.) ඒ අනුව අස්වැසුම ලබා නොදීම සම්බන්ධයෙන් මාගේ පෙත්සමට අදාළව නිලධාරීන් එය ලබා දීමට කටයුතු කර ඇති බවට තහවුරු වී ඇති නිසා එකී මාගේ 2025/06/26 දිනැති පෙත්සම සම්බන්ධයෙන් ඔබතුමා ගනු ලබන තීරණයකට මා එකඟ වන බවට ගෞරවයෙන් දන්වා සිටිමි.

තවද එලෙස අස්වැසුම ලබාදීමට තීරණය කළද, ලබා දීමට නියමිත මුදල මෙතෙක් නිශ්චිතව දැනුම් දී නොමැති නිසා අවශ්‍ය වුණොත් අලුත් පෙත්සමක් මගින් නැවත ඔබතුමා වෙත කරුණු ඉදිරිපත් කිරීමේ අයිතිය මා රඳවා තබා ගනිමි.

කෙසේ වෙතත් එලෙස අස්වැසුම ලබා දීමට තීරණය කිරීමට හේතුවූයේ ඔබතුමා විසින් 2025/07/18 දිනැති ලිපිය තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යැවීම මත වන අතර, ඉන් පසුව එම කාර්යාලයේ නිලධාරීන් සුහදශීලීව කටයුතු කර මෙතෙක් අවශ්‍ය කටයුතු කර දී ඇත. එමනිසා මාගේ මෙම ගැටලුවට ඔබතුමා මැදිහත් වී මා හට සහ මාගේ පවුලේ අයට සහනයක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට සහ ඔබතුමාගේ කාර්ය මණ්ඩලයට මාගේ විශේෂ ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

ස්තූතියි.

මෙයට - විශ්වාසී,

ජී.ආර්. ඉන්දික තුෂාර

(168)

එච්. ඒ. චන්ද්‍රපාල
නො. 193,
කිරිබේරිය පාර,
වඳුරාමුල්ල,
පානදුර.
2025.08.11

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමා
පළමු මහල
ආර්. ඒ. ද මෙල් මාවත
කොළඹ 04

11 AUG 2025

කොමසාරිස්තුමනි,

<u>ඔබගේ අංක OMB/2/7/1125/2022 යටතේ යොමු කර තිබූ පැමිණිල්ල සම්බන්ධවයි.</u>

ඉහත නම සහ ලිපිනය සඳහන් මා විසින් 2021-12-09 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ රත්මලාන දු. යා. ඉ උපදෙපාර්තමේන්තුවේ සේවයේ සිට විශ්‍රාම ගතිමි.

මා විශ්‍රාම ගැනීමෙන් පසු ලබමින් සිටි මූලික වැටුප විශ්‍රාම ප්‍රතිශතයට ගණනය නොකිරීම සම්බන්ධව ඔබතුමාට 2022/08/29 දින පැමිණිල්ලක් යොමු කරන ලදී.

ඒ අනුව ඔබතුමා දුම්රිය දෙපාර්තමේන්තුවේ උසස් නිළධාරීන් වෙත අදාල ගැටළුව සම්බන්ධව විමසීම් කර ඊට අදාල ඔබතුමාට ඇති බලතල ප්‍රකාරව ගැටළුව විසඳීම සම්බන්ධවද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්තුමාට 2025-07-18 [illegible] යොමු කරන ලද ලිපියේ කරුණු පාදක කර ගනිමින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජෙනරාල්තුමා විසින් මාගේ 2025 අගෝස්තු මස විශ්‍රාම වැටුපට අගය එකතු කිරීම සිදු කර ඇති බව කාරුණිකව දන්වමි.

මා විසින් යොමු කරන ලද පැමිණිල්ල මත අදාල විත්ති පාර්ශවය වෙත ලිපි යොමු කිරීමෙන් සහ දුරකතන ඇමතුම් ලබා දී කරුණු විමසීම සම්බන්ධව කොමසාරිස්තුමනි ඔබටත් ඔබතුමාගේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන පරිපාලන නිලධාරිතුමියද ලිපිගොනුව භාරව කටයුතු කළ ලිපිකාරිනි තුමියද ඇතුළු කාර්ය මණ්ඩලයට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරමි. ඒ අනුව ලිපිගොනුවේ වැඩකටයුතු ඉටු වූ බව දනුම් දෙමි.

මෙයට
විශ්වාසි,

....
එච්. ඒ. චන්ද්‍රපාල
071 7298767

9104 E/1/P/ම.ව.ලො/2814

2/7/1356

31 JUL 2025

එම්.අයි.අයිවන් අප්පුහාමි
අංක 108,
බිනරවාඩිය,
කටාන

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමාරිස්තුමා
පරිපාලන කටයුතු පිළිබඳ පා.කො.කාර්යාලය,
පළමු මහළ
අංක 14,
RA ද මෙල්මාවත,
කොළඹ 04

ගරු මැතිතුමනි,

පාසල් මුරකරු පත්වීම ස්ථිර කර විශ්‍රාම වැටුප් හිමිකම් සඳහා කරනු ලබූ අභියාචනය පිළිබඳව.

මිග / බම්බුකුලිය ජෝන්ද බැප්ටිස් විද්‍යාලයේ මුරකරු ලෙස සේවය කළ ඉහත නම් සඳහන් මාගේ කිසියම් හේතුවක් නිසා අහිමිව තිබූ ස්ථිර පත්වීම හා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දෙන ලෙස දැනුවත් කළ යුතු වගකිව යුතු සැම දෙනාටම අභියාචනා ඉදිරිපත් කළත් ඒ කිසිවකුගෙන් මා හට සාධාරණයක් ඉටු නොවූ බැවින් දැඩි මානසික පීඩනයකට ලක්ව සිටි මා අවසානයේ මාගේ දුක් ගැනවිල්ල ගරු ඔබ තුමා වෙත යොමු කළෙමි.

මාගේ බිරිඳි ඔත්පලව දැඩි මානසික ආතතියට ලක්ව සිටි මා හට ගරු ඔබතුමාගේ මැදිහත්වීම හේතුවෙන් වසරක් ඉක්මවීමටත් පෙර මාගේ පත්වීම ස්ථිර කිරීම හා විශ්‍රාම වැටුප් හිමිකම ලැබීම සිහිනයක් සැබෑ වූ සේම විය.

ගරු මැතිතුමන් ඔබ තුමාට මා සදාණයගැතිය, මට සාධාරණය ඉටු කරදීම පිළිබඳව ඔබ තුමාට සිය දහස් වාරයක් ස්තුතිවන්ත වෙමි. ඔබතුමාට නිදුක් නිරෝගී සුව හා දීර්ඝායුෂ ලැබේවා.

මෙයට
විශ්වාසි

....

2025-07-28

P/2/8/ P/3/1 308 8989

M. ෆවුසිල් මින්හා,
බයෝන් පාරෙහ
මීගහවතුර
මැදගම.

(166)

ජේ. බී. කේ. හිරිබුරේගම මහතා,
පරිපාලන කටයුතු පිළිබඳ
පාර්ලිමේන්තු කොමසාරිස්,
අංක 14
පළමු මහල
ආර්. ඒ. ද. මෙල් මාවත,
කොළඹ 04

/24

මාර්ග පහසුකම් ලබා ගැනීම

මහත්මයානනි,

ඉහත නම් සඳහන් ඉහත ලිපිනයෙහි පදිංචි මා මාගේ නිවසට යාම සඳහා මාර්ගයක් ඉල්ලා අවුරුදු ගනනාවක් තිස්සේ අදාල සියලු රාජ්‍ය ආයතන මගින් ඉල්ලීම් කලෙමි. ඊට අනුව මා හට නිවසට ප්‍රවිශය වීම සඳහා 2025 වර්ෂයේ ස්ථිර මාර්ගයක් ලබාදීමට වගකිව් යුතු රාජ්‍ය ආයතන මගින් ක්‍රියා කොට එම මාර්ගය ලැබුන. දැනට එම මාර්ගය ~~මා විසින්~~ පොදු මාර්ගයක් ලෙස සියලු දෙනා භාවිතා කරන බවද ඉතා සතුටින් දැනුම් දෙමි. තවද මෙම මාර්ගය මාගේ පෞද්ගලික [illegible] වියදමින් ගෝසර් යොදා සකස් කොට දෙපස ඉඩම් වෙන්වන ලෙස කටු කම්බි වැටයොදා සුරක්ෂිත කර ඇත.

මෙම මාර්ගය මා හට ලබා ගැනීමේදී ලා මහත් උනන්දුවෙන් හා ඕනෑකමින් කටයුතු කරමින් පසු විපරම් කල ඔබ තුමාට මාගේ හදපිරි කෘතඥතාවය, ස්තූතිය පුද කර සිටිමි.

ස්තූතියි
මෙයට
විශ්වාසී
M. ෆවුසිල් මින්හා

[illegible]

රේණුකා හේමාලි වික්‍රමසිංහ
500 D/1, නානායක්කාර මාවත,
කලුබෝව,
ඇල්පිටිය.
2025/07/10

17 JUL 2025

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමා,
අංක: 14,
ආර්.ඒ. ද. මෙල් මාවත,
කොළඹ 04.

ඊශ්‍රායලී කෘෂි රැකියාවට පිවිසුම නවතා දැමීම - තනුජ් නිශාන් වික්‍රමසිංහ
0774 - 296 296

තනුජ නිශාන් වික්‍රමසිංහ වන මාගේ සැමි පුරුෂයා හට ඊශ්‍රායල් කෘෂි රැකියාවකට ඉල්ලුම් කර වසර දෙකක් ගත වන තුරු රැකියාවට යාමට අවස්ථාව නොලැබීම සම්බන්ධව ඔබතුමා වෙත අභියාචනයක් යොමු කරන ලදි.

ඔබතුමා ඒ ගැන මැදිහත් ව මේ පිළිබඳ කටයුතු කරන බවට ලිපි මගින් අප දැනුවත් කරන ලදී.

මේ වන විට එනම් 2025.04.21 දින තනුජ නිශාන් වික්‍රමසිංහ වන මාගේ සැමි පුරුෂයා ඊශ්‍රායලයේ රාජ්‍ය වෙත කෘෂි රැකියාවක් සඳහා පිටත් ව ගිය බවට ඉහත නම් සඳහන් මා ඔබවෙත කාරුණිකව දැනුම් දෙමි.

එමනිසා අපගේ ගැටලුව විසඳා ගැනීමට ඔබතුමා ගේ මැදිහත් වීම ඉතා ඉහලින් අගය කරන අතර ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

මීට,
[signature]

P/2/4/5490/2023

164

එම්.ජී.ශ්‍රියාණි
ආර්ථික සහකාර.
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය.
කලාප 02,වලස්මුල්ල,
2025.06.25

PAPERS & DOCUMENTS OFFICE
30 JUN 2025
PARLIAMENT

පාර්ලිමේන්තු ලේකම් කාර්යාලය
11 JUL 2025
කවුළුව 04

ඔම්බඩ්ස්මන්,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

රා.ප.ව.ලේ.03/2016 අනුව වැටුප් යාවත්කාලීන කර ගැනීම සම්බන්ධවයි.

ඉහත නම් සඳහන් මාගේ රා.ප.ව.ලේ 03/2016 ට අනුව වැටුප් සකස් කර ගැනීමට වසර 10 පමණ කාලයක් ගතවිය. කළමණාකරණ සේවා දෙපාර්තමේතුවෙන්දීර්ඝ කාලයක් ලබා ගැනීමට නොහැකි වූ අනුමැතියඔබ තුමාගේ මැදිහත් වීම මඟින් ඉතා කෙටි කාලයකින් ලබා දීම නිසා මාගේ වැටුප මාහට පෞද්ගලික වන සේ MN -6 වැටුප් කේතය අනුව වැටුප් ගෙවීමදකුණු පළාත් කෘෂිකර්ම ලේකම්තුමා විසින් නිරදේශ කර ඇත.

ඒ අනුව මාගේ වැටුප අදාල වැටුප් කේතයට අනුව කොටසක් සකස් කර අවසන් කර ඇති අතර ඉතිරි කොටසෙහි ලිපි කටයුතු මේ දිනවල සකස් කරගෙන යනු ලැබේ.

මාගේ වැටුප් සකස් කර ගැනිමට ඔබ තුමාගේ මැදිහත් වීම මඟින්ම සිදුවූ දෙයක් ලෙස මම සලකමි.ඒ සඳහා ඔබ තුමා ලබා දුන් සහයෝගයට මාගේ කෘතඥපූර්ව ස්තූතිය පුද කරමි.

Siyani
....

එම්.ජී.ශ්‍රියාණි.
ආර්ථික සහකාර.

1245

163

ජී.පී.එච් .ලාලනී.
අංක.209,
රක්වාන පාර,
බටලන්ද,
පැල්මඩුල්ල.
2025.06.20

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්.
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය,
පළමු මහළ, අංක.14,
ආර්.ඒ.ද මැල් මාවත,
කොළඹ 04.

මහත්මයාණෙනි,

<u>වැන්දඹු විශ්‍රාම වැටුප ලබා ගැනීම සම්බන්ධවයි.</u>
<u>ජී.පී.එච්.ලාලානී (ලිපිගොනු අංකය. OMB/P/2/7/1246/2023)</u>

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මැදිහත් වීම මත, වර්ෂ 3 යි මාස 06 ක් ගත වී මාගේ විශ්‍රාම වැටුප 2025 ජූනි මාසයේ සිට හිඟ වැටුප් සමඟ ලබා ගැනීමට හැකි විය.

මාගේ පැමිණිල්ල පිළිබඳ ව සක්‍රීය දායකත්වයක් ලබා දී මා හට සිදු වීමට ගිය අසාධාරණයට, සාධාරණය ඉටු කිරීමට ප්‍රමුඛත්වය ලබා දීම සම්බන්ධයෙන් ගරු පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාටත් ඔබතුමාගේ කාර්ය මණ්ඩලයටත් මාගේ ගෞරවණීය කෘතඥතාවය මෙයින් පුද කර සිටිමි.

මෙයට
සේවා ලැදී,

ලාලනී
....
(ජී.පී.එච්.ලාලනී)

2/7/1169

162

ඒ.සී.ආර්.ඩී. අබේනායක
තලගහයාය
ගනේගොඩ
නාරම්මල
2025.06.17

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් තුමා
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය
පළමු මහල
අංක 14
ආර්. ඒ. ද මෙල් මාවත
කොළඹ 04

20 JUN 2025 ... 04

ස්ථිර සේවා කාලයට ලි.ප: ආදේශක සේවා කාලය ඇතුළත් කර සංශෝධනය කර ලබා ගැනීමට පැමිණිල්ල ඉදිරිපත් කිරීම සම්බන්ධව ඒ.සී.ආර්.ඩී. අබේනායක (පැමිණිලිකරු)

වසර හයක් නියමිත සේවා කාලයට වූතම වැටුප් නොලැබීම සම්බන්ධයෙන් ඉතාම [illegible] මා විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් සාධාරණ විනිශ්චයක් ලබා දීමට කටයුතු සලසා දුන් ඔබ තුමාටත් කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයංගම ස්තූතිය පුද කරන අතර පැමිණිලිකරු වන මා හට මෙම සංශෝධනය මගින් නියමිත වූතම වැටුප් ලබා දීමට ගත් ක්‍රියාකාරී පිළිබඳව දැනුම් දෙන ලෙස සලකමි.

ස්තූතියි
මීට
පැමිණිලිකරු
[illegible]

6409

(161)

ඔබේ අංක : OMB/P/2/2/4014/2023

ඩී.එන්. රණවීර,
213/6,
බාලිකා නිවාස පාර,
රුක්මලේ,
පන්නිපිටිය.

පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය
අංක 14
26 MAY 2025
කොළඹ 04

2025.05.21

විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු කේ.බී.කේ. හිරිඹුරේගම මහතා,
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්),
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය,
පළමු මහල, අංක 14,
ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 04.

මැතිතුමණි,

ඉඩම් ආරවුල විසඳා ගැනීම.
පැමිණිලි පාර්ශවය - ඩී.එන්. රණවීර / එස්. රණවීර

ඉහත සඳහන් මාකර/ප්‍ර/5534 දීමනා පත්‍රය ට අදාළ මුල් උරුමය සහිත බල පැවරුම් ලිපිය 2025.05.19 දින මුලටියන ප්‍රාදේශීය ලේකම්තුමිය වෙතින් ලබාගත් බව ඔබතුමන්ට දැනුම් දෙන්නේ කෘතවේදී පූර්වක හදපිරි ගෞරවයෙනි. ඔබතුමන්ගේ මැදිහත් වීම, උපදේශනය, නියෝගයන් නොවන්නට දෙමාපිය උරුමයෙන් මට හිමි ඉඩම් කොටස අහිමි විමට නියමිතව තිබුණි.

මෙම ඉඩමෙන් පර්චස් තිහක (පර්. 30) බිම් ප්‍රමාණයක් මාතෘ හා ළමා සායනයක් තැනීම සඳහා ප්‍රදානය කිරීමට මා බලාපොරොත්තුවන අතර එම පිං මාගේ දෙමාපියන් දෙපළටත් විශේෂයෙන් ඔබතුමන්ටත් අනුමෝදන් කරන අතර ඒ පිං බලයෙන් ඔබතුමාට නිදුක් නිරෝගී සුවය ලැබේවා කියා මා හදවතින් ම ප්‍රාර්ථනා කරමි.

ස්තුතියි !

මෙයට
විශ්වාසී

ඩී.එන්. රණවීර

6199
ශ්‍රී.ප.ස

160

No:

Date:

ශ්‍රී.ප..ස

එස්. ආර්. එදිරිසිංහ
අංක: 4
දිවුල්වත්ත
නිවාස පෙළ
කොටගල්ල
01.05.2025

පරිපාලන කටයුතු පිළිබඳ
පාර්ලිමේන්තු කොමසාරිස් තුමා
පරිපාලන කටයුතු පිළිබඳ
පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය
පළමු මහල, අංක: 14
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

මැතිතුමනි,

කොළඹ - ගාල්ල - හම්බන්තොට වැල්ලවාය මාර්ගයේ
අංක: 197/3 පළුව - කොටගල්ල
CMB/P/2/2/3854/2023 ඔබේ අංකය.

ද.කා.වි. 315 වන කොටස් අංක: 241, 242, 243 ට අදාළ
නියමිත වන්දි හා ඊයට ලැබිය යුතු පොලිය ද
2025 අප්‍රේල් 29 වන දින ලැබුණු බවත්.

අවු: 20 ක් තිස්සේ අපට ලැබිය යුතු මෙම වන්දි
නොගෙවීම සම්බන්ධව විභාග කර ඔබ වන්දි ලබා
දීම සඳහා කටයුතු කිරීම සම්බන්ධව මාගේ හෘදයාංගම
ස්තුතිය ඔබ තුමාට හා කාර්ය මණ්ඩලයට පුද කරමි
මෙම සියලු කටයුතු අවසන් වී ඇති බව ද දන්වමි

මෙයට, විශ්වාසී,
එස්. ආර්. එදිරිසිංහ

6923

(159)

එන්. ජී. ඒ. චන්ද්‍රසෝම
අංක 96, "ස්වස්ථික",
වේරගොඩ,
කහව,
අම්බලන්ගොඩ හරහා.
2025-04-22

25 APR 2025

කේ. බී. කේ. හිරිඹුරේගම මහතා,
පරිපාලන කටයුතු පිළිබඳ
පාර්ලිමේන්තු කොමසාරිස් තුමා,
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු
කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)
කාර්යාලය, පළමු මහල,
අංක 16, ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 4.

මහත්මයාණනි,

ඔබේ අංක OMB/P/2/7/1222/2022 තනතුර නිවැරදි කරවා ගැනිම හා නිවැරදි ලෙස විශ්‍රාම වැටුප සකසා ගැනීම සම්බන්ධවයි. එන්. ජී. ඒ. චන්ද්‍රසෝම (පැමිණිලිකරු)

ඉහත නම සහ ලිපිනයේ පදිංචි මා විසින් 2023-05-08 දින ඔබ තුමා වෙත ඉහත පැමිණිල්ල ඉදිරිපත් කරන ලද අතර මේ සඳහා මා හට හිමි උසස්වීම් දෙකද නිවැරදි කර ලබාදී ඇත. එම තනතුරු දෙකට අදාල වැටුප් ද සකස්කර දී ඇත. අදාල තනතුරු සඳහා නියමිත වැටුපද හිඟ වැටුප් ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් සකසා මාර්තු මස වැටුපට එම මුදල් ලබාදී ඇත.

මේ සම්බන්ධව ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරමින් කරන ලද සේවයට බෙහෙවින්ම ස්තුති වන්ත වන අතර ඔබතුමාගේ කාර්ය්‍ය මණ්ඩලය විසින් කරන ලද සේවයට ස්තුතිවන්ත වෙමි.

මෙයට,
විශ්වාසී,

9091

(158)

වෛද්‍ය විශ්ම සජිත් ඕපාත,
130 ඒ / 1,
වට රවුම්පාර,
පොතුපිටිය,
වාද්දුව.
2025.04.10.

17 APR 2025

යොමුව - OMB/P/2/5/4805/2024

පරිපාලන කටයුතු පිළිබඳ කොමසාරිස්තුමා,
පළමු මහල, අංක 14,
ආර්. ඒ. ඩී. මැල් මාවත,
කොළඹ 04.

ගරු මැතිතුමනි,

<u>වැටුප් සකස් කිරීම නොසලකා හැරීම සම්බන්ධවයි.</u>

උක්ත කාරණය පිළිබඳව උගත් ඔබතුමා වෙත සහණයක් අපේක්ෂාවෙන් අදාල කාරණය පැමිණිලි කරන ලදී.

ඒ අනුව උගත් ඔබ තුමාගේ මැදිහත් වීමෙන් ප්‍රශ්ණගත කාරණය ඉටු විය. ඒ පිළිබඳව මා උගත් ඔබතුමා වෙත අතිශයින් කෘතඥ වෙමි.

මෙයට ,

DR. V. S. OPATHA
MBBS (Colombo) PG Dip (Palliative Medicine)
Adv. Certi in Child Protection and Psychology
SLMC Reg. No: 34939

වෛද්‍ය විශ්ම සජිත් ඕපාත.

5058 - ගොනුව

(157)

එච්.ලියනගේ සරත්

නො 311/බී/3, ඇල්හේන,

හේලිපාර,

ඇක්තිලිගොඩ.

ගාල්ල.

2025 පෙබරවාරි මස 16 දින.

03 MAR 2025

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

පලමු මහල, අංක 14,

ආර්.ඒ.ද මෙල් මාවත,

කොළඹ 04.

ගරු මැතිතුමනි,

<u>**කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා සහනයක් ලබා ගැනීමට රාජ්‍යසේවා කොමිෂන් සභාවට කරණ ලද අභියාචනය සම්බන්ධවයි (එච්.ලියනගේ සරත්)පැමිණිලිකරු.**</u>

උක්ත කරුණට අදාල ඔබේ අංක OMB/P/2/7/1189/2023 ලිපිය හා බැදේ,

එයට අනුවදක්ත කරුණ අදාල මාගේ වැටුප් වර්ධක හා වැටුප් වර්ධක වලට අදාල හිග මුදල් සියල්ලද ඔබතුමාගේ මැදිහත්වීම අනුව මේ මස වැටුපත් සමග මා වෙත ලැබුන බව ඉතා සතුටින් දන්වා සිටිමි.

මාගේ මූලික ඉල්ලීම ඉදිරිපත්කල දින සිට රාජ්‍යසේවා කොමිෂන් ආයතනයට,බන්ධනාගාර මූලස්ථානයට හා අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අවස්ථා ගණනාවකදී ඒ ඒ අවස්ථාවට අනුව ලිපි රාශියක් ඉදිරිපත් කරමින් අදාල කාර්යය ඉටුවෙන තෙක්ම නොකඩවා මා වෙනුවෙන් පෙනී සිටීම සම්බන්දයෙන් ඔබතුමාට ගෞරවනීය ස්තූතිය පුද කරමි.

අගතියට පත්වූ මා වැනි රාජ්‍ය සේවකයින්ට ඉදිරියටත් ඔබතුමාගේ සේවය ලබාදීමට ධෛර්යය හා වාසනාව ලැබේවායි පතමි.

ස්තූතියි

එච්.ලියනගේ සරත්

උඩුගල් අලුත්ත ජනපදය. 1798
209/8A
හොරණ
අතුරුගිරිය.
2025. 02. 15.

21 FEB 2025

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් තුමා,
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය
වලවු පාර
අංක 14
ආර්. ඒ. ද මෙල් මාවත.
කොළඹ 04.

කොමසාරිස් තුමනි!

ඔබතුමාගේ අංක OMB/P/2/7/1258/2023 දරණ ලිපිය සම්බන්ධවයි.

ඉහත කරුණ හා ලිපියට අදාළව මා ඔබතුමා වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය විභාග කිරීමෙන් අනතුරුව, මා හට හිමි විශ්‍රාම වැටුප ලබාගැනීමට අවස්ථාව හිමි විය. ඒ අනුව විශ්‍රාම වැටුප 2025 පෙබරවාරි මස සිට නැවත ලබාගැනීමට හැකිවන ලදී.

2. ඉහත පරිදි මට එම අවස්ථාව ලබාගැනීමට හැකිවන ලැබුනේ. ඔබතුමා, අනුමත ඔබ ආයතනය මගින් සිදුකරන ලද පූර්ණ මැදිහත් වීමේ ප්‍රතිඵලයක් ලෙසයි. කාලෙන් රාජ්‍ය සේවයේ වසර 34 ක් සේවය කරන ලද නිලධාරියකු වන මා හට ඔබ ආයතනයේ මැදිහත් වීම මත, ඉතා විශාල සහනයක් කෝට්ට එම ගැටලුව විසඳිලා ගැනීමට අවස්ථාව හිමි විය. මෙවැනි ආයතන රටට මහගු ප්‍රතිඵල ගෙනදෙන ආයතන බවත් මා දනිමි. ජනතාවට මෙන්ම රටටද එවැනි ප්‍රතිඵලදායක ආයතනයක් ලෙස හැකිවිය යුතුය. විශේෂයෙන්ම ඔබතුමා, එම නිලධාරීන් හට

No:
Date:

P2/2/4151

H. රමණී කුමාරිහාමි
නො. 514,
ගලේවිදුනුගොඩ,
බොරලන්ද
2025.01.27

0.5 FEB 2025

රාජ්‍ය සේවාවන් කටයුතු පිළිබඳ
පාර්ලිමේන්තු කොමසාරිස්තුමා.
පළමු මහල, අංක 14,
ආර්. ඒ. ද මෙල් මාවත
කොළඹ - 04

ඉඩමේ අනුමැතිය ලබාදීම.

2025.01.07 දිනැති ඔබතුමාගේ ලිපිය හා බැඳේ. ඉහත නම සහ ලිපිනය සඳහන් මාගේ ඉඩමේ සැලැසුම අංක 9040 දරන පිඹුරුපත බොරලන්ද නගර සභාව මගින් 2024.10.24 දින අනුමත කර ඇත. නමුත්, 2024.09.04 දින මා විසින් [illegible] ලිපිය අනුව ය. එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

ඒ පිළිබඳ ඔබතුමා මැදිහත් ව [illegible] සභාපතිතුමාට ගෞරවය ස්තූතිය පුද කරන අතර කාර්ය මණ්ඩලයට ද ස්තූතිය පුද කරමි.

මෙයට
විශ්වාසී
Ramani.

ශිෂ්‍යයා පිළිබඳ කොදනුවන් විශේෂඥයන් සහ තත්ත්ව වාර්තා
කිරීම සම්බන්ධව ගෙනෙ එන් පනත්වාන්න වේ. ඉදිරියේදී
ළමයින් ඔහු නාමත් පොවය කිරීමට සහතික මූලික ප්‍රයෝගය
ප්‍රශ්නතාව ලැබුණා මෙම අවශ්‍ය පිය ඇතියේ. ඒ අනුව
මා හට ලැබුණි. ගැටලුව විශේෂක ලක් කිරීමට සහ තොරතුරු
මැදිහත් වීම තුළින් මා හට මානසික සහනයක් ලැබුණි
ප්‍රාර්ථික වශයෙන්ද මගේ සහනයක් ලැබුණ බව කෘතඥතාව
ප්‍රකාශ කරමි.

මෙයට
විශ්වාසී,

ප. A. ජයසිංහ.

1414

යූ.පී.ජී. විමලසේන,
අංක 735/බී,
ලීලාරත්න මාවත,
කන්තලේ.
2025/01/07
0716803260

15 JAN 2025

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔන්බුස්මන්)
ගරු විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු කේ.බී.කේ,හිඹුරේගම මැතිතුමා,
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොසාරිස් (ඔන්බුස්මන්) කාර්යාලය,
පළමු මහල, අංක 14 ,ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 04.

ගරු මැතිතුමනි,

<u>ගෞරවනීය ස්තූතිය පල කිරිම</u>

යොමු අංකය omb/p/2/7/1136/2022

පැමිණිල්ලේ ස්වභාවය:- විශ්‍රාම වැටුපට හිමිකම් පෑමේ අවස්ථාව අහිමි කිරීම
- යූ.පී.ජී. විමලසේන

මාහට සිදුවූ අසාධාරණයට ,සාධාරණයක් අයදිමින් 2022/09/13 වන දින ගරු ඔබතුමාවෙත පැමිණිල්ලක් කළෙමි.මේ පිළිබදව ගරු ඔබතුමා නොපමාව මැදිහත්වෙමින් නැගෙනහිර පළාත්පාලන කොමසාරිස් තුමා වෙතින් වාර්තාවක් කැඳවන ලද අතර, එතැන් සිට මේ දක්වා වරින් වර ගරු ඔබතුමා විසින් පළාත් පාලන කොමසාරිස් ගෙන් පවතින තත්වයන් පිළිබඳව විමසීම් කරනු ලැබිය.

විසඳුමක් සඳහා නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්තුමා ද පළාත්පාලන කොමසාරිස් තුමා ද දැඩි උනන්දුවක් දක්වනු ලැබීය.

අවසන් ප්‍රතිපලයක් ලෙස මා මෙන් ම දිවයිනේ භාරදහසකට අධික සේවක පිරිසකට සහනයක් ලබා දෙමින් 2024/12/23 වන දින ගරු අමාත්‍ය මණ්ඩලය විසින් අසාධාරණයට ලක්වූ අපහට විශ්‍රාම වැටුප් ලබා දිමට තීරණය කර ඇත.

ට අනුව ගරු රාජ්‍ය පරිපාලන ස්වදේශීය කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් තුමා විසින් මීට අදාලව 2024/12/30 වන දින චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව ගරු ඔබ තුමාවෙත ගෞරවයෙන් දන්වා සිටිමි.

15 JAN 2025

ගරු ඔබතුමාටත් මීට පෙර හිටපු පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔන්බුස්මන්) ගරු විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමාටත් ඔන්බුස්මන් කාර්යාලයේ සියළු නිලධාරීන්ටත් මා වෙනුවෙන් දක්වන ලද කරුණා සහගත සේවය වෙනුවෙන් මාගේ ගෞරවනීය ස්තුතිය මෙයින් පලකර සිටිමි.

චක්‍ර ලේඛය අනුව මාහට විශ්‍රාම වැටුපට හිමිකම් පෑමට අවස්ථාව උදාවී ඇතැයි විශ්වාස කරමි. ගරු ඔබතුමා විසින් 2024/12/19 දින පලාත්පාලන කොමසාරිස්තුමාට ද පිටපත් සහිතව මාවෙත එවන ලද ලිපියේ සඳහන් පරිදි ගෙවීම් කරන ලද විගස ඒ බවද දැනුම් දීමට කටයුතු කරන බව ඉතා කාරුණිකව හා ගෞරවයෙන් යුතුව දන්වා සිටිමි.

ස්තූතියි!
මෙයට විශ්වාසී.

යූ.පී.ජී. විමලසේන

පිටපත් :-

ගරු ජනාධිපති තුමා
ගරු රාජ්‍ය පරිපාලන ස්වදේශීය කටයුතු
පළාත් සභා හා පළාත් පාලන අමත්‍ය තුමා,
ගරු රාජ්‍ය පරිපාලන ස්වදේශීය කටයුතු
පළාත් සභා හා පළාත් පාලන අමත්‍යාංශ ලේකම් තුමා,
ගරු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්තුමා pen/pol/2B/732
ගරු නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් තුමා Ep/01/doc(c) 018
ගරු නැගෙනහිර පළාත් පාලන කොමසාරිස් තුමා -Ep/14/Es/min/grade/45yrs

කා.දැ.පි.